| දිසා අධිකරණය | 383 | 03 | 24 | 404 |
| මහේස්ත්‍රාත් අධිකරණය | 60 | 43 | – | 17 |
| ප්‍රාථමික අධිකරණය | – | – | – | – |
| කම්කරු විනිශ්චය සභාව | 03 | – | 03 | 06 |
| කම්කරු ආරවුල් | 09 | 07 | – | 02 |

| | | | | |
|---|---|---|---|---|
| මානව හිමිකම් කොමිෂන් සභාව | 11 | 09 | – | 02 |
| ඔම්බුඩ්ස්මන් | – | – | 01 | 01 |
| **එකතුව** | **563** | **65** | **48** | **547** |

**12. විමර්ශන අංශය**

**සංයුතිය**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 2 | මාන්ඩලික සහකාර | 02 |
| 4 | ලිපිකරු | 01 |
| 6 | යතුරු ලේඛක | 01 |
| | ක්ෂේත්‍ර නිලධාරි | 02 |
| 7 | කාර්යාල කාර්ය සහායක | 01 |

**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විමර්ශන අංශයේ අධ්‍යක්ෂ ලෙස ගාමිණි ගුණවර්ධන මහතා යුතු කරනු ලබයි**

පුද්ගලයින්ගෙන් සහ ආයතන වලින් ලැබෙන්නා වූ ඉඩම් පැමිණිලි සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කිරිම

ii ඊට අදාල පාර්ශවයන් කැඳවා පරීක්ෂණයන් පැවැත්විම හා ගැටළුව විසදිමට අවශ්‍ය සුදුසුම ක්‍රියාමාර්ගයන් යෝජනා කිරිම

iii ගැටළු සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ, ස්ථාන පරීක්ෂණ හා විමර්ශන කටයුතු සිදුකිරිම

i. සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ සංඛ්‍යාව 21

ii.. කාර්යාලය තුල කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව 38

iii. සමතයට පත්කල පරීක්ෂණ සංඛ්‍යාව 10

**13. මුදල් අංශය**

**සංයුතිය**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යක්ෂ (වැ. බ. ) | 01 |
| | සහකාර අධ්‍යක්ෂ | 01 |
| 2 | මාන්ඩලික සහකාර | 01 |
| 4 | ලිපිකරු | 07 |
| 5 | ගිණුම් නිලධාරි | 03 |
| 6 | යතුරු ලේඛක | 01 |
| 7 | කාර්යාල කාර්ය සහායක | 01 |

**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මුදල් අංශයේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස ශ්‍යාමලී රත්නායක මිය කටයුතු කරනු ලබයි**

i. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සියළුම නිලධාරින්ගේ මාසික වැටුප් හා දීමනා ගෙවීම කිරීම

ii නිලධාරින්ට අයත් සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් නියමිත දිනයන්හිදී තැන්පත් කිරීම

iii මාසික ගිණුම් වාර්තා සකස් කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම

iv මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන නියමිත දිනට සකස් කර අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීම

v. මාසික හා වාර්ෂික ගිණුම් ප්‍රකාශන විගණකාධිපති හා අමාත්‍යාංශය වෙත යොමු කිරීම

vi ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ලැබෙන්නා වූ ආදායම් මුදල් වඩාත් අවශ්‍යම දේට පමණක් වියදම් කර ඉතිරි මුදල් වඩාත් ඵලදායි ලෙස අයෝජනය සඳහා යෙදවීම.

**14. ආදායම් අංශය**

**සංයුතිය**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| | අධ්‍යක්ෂ | 01 |
| 1 | සහකාර අධ්‍යක්ෂ | 01 |
| 2 | මාන්ඩලික සහකාර | 01 |
| 4 | ලිපිකරු | 03 |
| 6 | ක්ෂේත්‍ර නිලධාරි | 01 |
| 7 | කාර්යාල කාර්ය සහායක | 01 |

**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ආදායම් අංශයේ අධ්‍යක්ෂ ලෙස එල්. පද්මසිරි මහතා කටයුතු කරනු ලබයි**

i. ඉඩම් බදුදීම්, විකිණීම් වලින් ලැබෙන්නා වූ ආදායම් රැස් කිරිම හිග බදු මුදල් අයකර ගැනිමට සුදුසු පියවරයන් ගැනිම

ii බණිජ සම්පත් සහ වෙනත් ආදායම් මාර්ගවලින් ලැබෙන්නා වූ ආදායම් එකතු කිරිම

iii ඉඩම් අත්පත් පරිකෂණ සඳහා සහභාගිවිම සහ එයින් ලැබෙන්නා වූ ආදායම රැස් කිරිම

iv සැගවුණු ඉඩම් සොයා ගැනිමෙන් පසුව එයින් ලැබෙන්නා වූ ආදායම් එක්රැස් කිරිම

**2010.12.31 දිනට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රගතිය**

| **විස්තරය** | **2009 වර්ෂය** | **2010 වර්ෂය** |
|---|---|---|
| ඉඩම් බදු දීම් | රු. 35563716.00 | රු. 60601931.00 |
| මැණික් ඉඩම් බදු දීම | රු. 2752313.00 | රු. 3410005.00 |
| ඉඩම් විකිණීම හා අත්පත් වන්දි | රු. 563515.06 | රු. 53990588.00 |
| වෙනත් ආදායම් | රු. 21326325.00 | රු. 21268449.00 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**


මගේ අංකය / எனது இல. } එල්පී/ඒ/එල්ආර්සී/එෆ්ඒ/2011/04 | ඔබේ අංකය / உமது இல / Your No. } | දිනය / திகதි / Date } 2012 නොවැම්බර් 08 දින

සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 56 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2012 ජූලි 17 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දැක්වෙන කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone } 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

## 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වල ප්‍රතිඵලයක් ලෙස ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තා ගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංග වලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

අ) <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 03</u>

ශේෂ පත්‍ර දිනයේ සිට මාස 12 කට වැඩි කාලයකින් නිරාකරණය කල යුතුව පවතින සහ මාස 12 කට වැඩි කාලයක් සඳහා විලම්භනය කල හැකිව පවතින බැරකම් ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කල යුතු වුවද සභාව විසින් රු.33,353,350 ක් වූ සේවක පාර්තෝෂික සඳහා වෙන් කිරීම ජංගම වගකීම් යටතේ වර්ගීකරණය කර තිබුණි.

ආ) <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18</u>

වත්කමක් ලෙස හඳුනා ගැනීමෙන් පසු දේපල පිරියත හා උපකරණ අයිතමයන්හි සාධාරණ අගය විශ්වාසදායි ලෙස මැනිය හැකි විට එහි වටිනාකම ප්‍රත්‍යාගණිත අගයට ඉදිරිපත් කල යුතු නමුත් සභාව විසින් දේපල පිරියත හා උපකරණ අයිතම 06 කට අදාල රු.38,448,537 ක වටිනාකම සඳහා ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

ඇ) <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 36</u>

සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට එරෙහිව හා සභාව විසින් විවිධ කරුණු සම්බන්ධව අධිකරණවල නඩු 639 ක් පවරා තිබු අතර එයින් නොවිසඳුණු නඩු 583 සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

ඇ) <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40</u>

සභාව විසින් අත්පත් කරගෙන ඇති ඉඩම්, ගිණුම්කරණ ප්‍රමිති 40 අනුව ආයෝජන දේපල ලෙස හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට සභාව සතු ඉඩම් අක්කර 546,141 හි වටිනාකම රු.676,169,345 වශයෙන් දක්වා තිබුණු නමුත් මෙම ඉඩම් පිළිබඳ විස්තරාත්මක උපලේඛනයක් හෝ ඉඩම් ලේඛනයක් සභාව සතුව නොතිබුණි. මීට අමතරව 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.642,977,590 ක් වූ ඉඩම් විකුණුම් ආදායමට අදාල පිරිවැය සම්බන්ධයෙන් ගිණුම් වලට ගැලපීම් කර නොතිබුණු අතර, ඊට අදාල ඉඩම් ප්‍රමාණය සම්බන්ධ තොරතුරු කිසිවක්ද විගණනයට ඉදිරිපත් නොවිය. මේ අනුව මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති ඉඩම් වල වටිනාකමේ නිරවද්‍යතාවය විගණනයේදි තහවුරු කර ගැනීමට නොහැකි විය.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

අ) සභාවේ ආදායම් හා වියදම් ගිණුම් ගත කිරීමේදි මුදල් පදනම හා උපචිත පදනම යන දෙආකාරයම අනුගමනය කර ඇති බව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර තිබුණි .

ආ) 2010 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 1.1 හි මැනුම් ගාස්තු ආදායම වෙනම අයිතමයක් ලෙස දක්වා තිබුණද, 2011 වර්ෂයේදී එය කොමිෂන් සහ ගාස්තු වලට එකතු කර දක්වා තිබුණි.

ඇ) සභාවේ ඉඩම් විකුණුම් ආදායමින් 60%ක් මෙහෙයුම් වියදම් ලෙසද 40% ක් සංචිත ලෙසද වෙන් කරන නමුත් ඒ සඳහා ලබාගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුණි. තවද, ඉඩම් විකුණුම් ආදායමින් රාජ්‍ය ආදායමට කිසිදු දායකත්වයක් නොවන බවද නිරීක්ෂණය විය.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත පරිදි සාරාංශ කර ඇත.

| විස්තරය | වටිනාකම රු. | මූල්‍ය ප්‍රකාශනවලට වූ බලපෑම |
|---|---|---|
| අ) භාණ්ඩාගාර බිල්පත් අංක 101742 | 574,781 | ශේෂපත්‍ර දිනට බිල්පත් වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. |
| | 1,583,167 | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම වැඩියෙන් දක්වා තිබුණි. |
| | 1,577,255 | ආයෝජන අවස්ථාවේ ලැබී තිබියදීත්, ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම වශයෙන් දක්වා තිබුණි. |
| ආ) ස්ථාවර තැන්පතු අංක 219702 | 3,197,828 | ශේෂපත්‍ර දිනට තැන්පතු වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. |
| | 1,220,674 | ස්ථාවර තැන්පතු මත පොලී ආදායම අඩුවෙන් දක්වා තිබුණි. |
| | 804,020 | ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ආදායම අඩුවෙන් දක්වා තිබුණි. |
| | 2,458,226 | ඉදිරියට ලද ස්ථාවර තැන්පත් පොලී ආදායම වැඩියෙන් දක්වා තිබුණි. |
| | 122,055 | රඳවා ගැනීමේ බදු වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි. |
| ඇ) පාරිතෝෂිත වෙන් කිරීම | 385,987 | මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. |
| ඇ) ගෙවල් කුලී වියදම | 1,245,810 | මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. |



97

ඉ) ඉඩම් පවරා ගැනීමේදී හිමිවිය යුතු අවම ඉඩම් ප්‍රමාණය හිමිනොවීම නිසා සභාවට එරෙහිව අභියාචනාධිකරණයේ පවරන ලද නඩුවක පැමිණිලිකරුවන්ට 2009 වර්ෂයේදී රු.148,715,363 ක් ගෙවීමට තීන්දුවක් ලබා දී තිබුණද ඒ සඳහා මූල්‍ය ප්‍රකාශන වල වෙන්කිරීම් කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට පොලියද එකතු වීමෙන් ගෙවිය යුතු මුදල රු. මිලියන 200 ඉක්මවා තිබුණි.

### 2.2.4 නොසැසඳු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සහ ඊට අදාල උපලේඛන පරීක්ෂාවේදී රු.180,012,834 වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ගිණුම් විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. | උපලේඛන අනුව ශේෂය රු. | වෙනස රු. |
|---|---|---|---|
| පාසල් පොත් උපකරණ හා ආපදා ණය ගිණුම | 21,911,846 | 21,978,201 | 66,355 |
| දිස්ත්‍රික් කාර්යාලීය ඉඩම් විකුණුම් ආදායම | 6,077,443 | 5,765,012 | 312,431 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම් ගිණුම | 11,663,944 | 11,615,533 | 48,411 |
| ගෙවිය යුතු කල් බදු ගිණුම | 1,221,688 | 1,363,490 | 141,802 |
| ඉඩම් විකුණුම් ආදායම ආදායම් අංශයේ වාර්තා අනුව | 148,234,358 | 134,698,247 | 13,536,111 |
| ඉඩම් විකුණුම් ආදායම ඉඩම් විකුණුම් ලේඛනය අනුව | 148,234,358 | 67,634,310 | 80,600,048 |
| ගොඩනැගිලි කුලී ලිපි ගොනුව | 13,483,422 | 40,872,000 | 27,388,578 |
| ණයගැති ශේෂය | 15,552,254 | 5,223,000 | 10,329,254 |
| හිඟ බදු මුදල | 19,363,565 | 66,953,409 | 47,589,844 |
| එකතුව | | | 180,012,834 |

### 2.2.5 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

අ) සභාවේ වෙළද ණයගැතියන්ගේ වර්ෂ 9 කට වැඩි රු.2,153,918,749 ක් වූ ශේෂය සහ වර්ෂ 12 කට වැඩි රු.2,921,575 ක් වූ විවිධ ණයගැති ශේෂය සඳහා අඩමාන ණය වශයෙන් දීර්ඝකාලයක සිට රු.8,270,356 ක අවල වටිනාකමක් වෙන්කර තිබුණු අතර ණය අය කර ගැනීම සඳහා 2011 වර්ෂය තුලදීද සභාව ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

ආ) සභාවේ නිලධාරීන් 47 දෙනෙකුගෙන් රු.760,843 ක් වූ ණය වාර්ක මුදල් 2010 වර්ෂයේ සිට අය කර ගෙන නොතිබුණි.

ඇ) ඉඩම් බදු අත්තිකාරම් ගිණුමේ රු.13,890,850 ක ශේෂයක් පැවති අතර මෙම ශේෂයෙන් රු.10,275,000 ක ප්‍රමාණයක් වර්ෂ 7 කට වැඩි කාලයක්ද රු.990,850 ක් වර්ෂ 5කට වැඩි කාලයක්ද ගිණුම් වල ඇතුලත්ව තිබුණි. මෙවැනි ඉඩම් සම්බන්ධයෙන් බදු ගිවිසුම් ලබා දී බදු ආදායම් වර්ධනය කර ගැනීමට හෝ උත්තිකාරම් නිරවුල් කර අදාල ඉඩම් නැවත පවරා ගැනීමට හෝ විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ඈ) ලැබිය යුතු ආදායම් ගිණුමේ රු.42,143,911 ක් වූ ආරම්භක ශේෂයෙන් වර්ෂය තුලදී ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී වටිනාකම වූ රු.12,412,301 පමණක් අයවී තිබුණු අතර අයවී නොතිබුණු රු. 29,731,610 වටිනාකම සකස් වූ ආකාරය හෝ දැක්වෙන කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවුණි.

ඉ) අත්පත් වන්දි අවිනිශ්චිත ගිණුම් (I) හා (II) හි රු.241,247,176 ක ශේෂයක් පැවති අතර ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 34 (2), 35 වගන්ති ප්‍රකාරව ඉඩම් අත්පත් කර ගැනීමේදී අදාල ඉඩමේ භුක්තිය භාරගත් දින සිට අත්පත් වන්දිය ගෙවන තෙක් 10% ක පොලියක් ගෙවිය යුතු වුවද, සභාව විසින් ඒ වෙනුවෙන් වාර්ෂික වෙන් කිරීමක් සිදු කර නොතිබුණි. තවද වන්දි අවිනිශ්චිත (II) ගිණුමේ ශේෂය අඛණ්ඩව වසර ගණනාවක් තිස්සේ නොවෙනස් ව පවතින අතර එම ශේෂයන් නිරවුල් කිරීම සඳහාද සභාව නිසි පියවර ගෙන නොතිබුණි.

ඊ) 2011 දෙසැම්බර් 31 දිනට ඉඩම් විකුණුම් අත්තිකාරම් ශේෂය රු. 12,807,192 ක් වූ අතර එයින් රු. 12,327,192 ක් පුද්ගලයින් 434 කට අදාල වර්ෂ 3 සිට වර්ෂ 7 දක්වා පැරණි ඒවා විය. එසේ වුවද, රු. මිලියන 12 ඉක්මවූ ශේෂ නිරවුල් නොවී පැවතියදීත් 2010 හා 2011 වර්ෂවලදී ද බාහිර පුද්ගලයින් 18 දෙනෙකුගෙන් ඉඩම් ලබාදීම සඳහා රු. 890,000 ක් අත්තිකාරම් වශයෙන් ලබාගෙන තිබුණි.

**2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| ගිණුම් විෂය | ශේෂය (රු.) | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| අ) ස්ථාවර වත්කම් | | |
| i. ඉඩම් | 676,169,345 | ඉඩම් පිළිබද විස්තර ඇතුලත් උපලේඛන |
| ii. අනෙකුත් ස්ථාවර වත්කම් | 55,510,447 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ආ) ලැබිය යුතු ආදායම් | 29,731,610 | ශේෂ සනාථ කිරීම්, විස්තරාත්මක උපලේඛන |
| ඇ) වන්දි අවිනිශ්චිත ගිණුම | 241,247,176 | විස්තරාත්මක උපලේඛන |
| ඈ) ඉඩම් විකිණීම් හා අත්පත් කිරීම් පොලී | 5,057,163 | ශේෂය සකස්වූ ආකාරය දැක්වෙන විස්තර |
| ඉ) දැව විකිණීම | 5,025,512 | දැව තක්සේරු කිරීමට අදාල ලිඛිත සාක්ෂි |
| ඊ) පීපල්ස් ලීසිං සමාගමේ කල් බදු වටිනාකම | 5,104,152 | ශේෂ සනාථ කිරීම් |
| උ) ඉඩම් අත්පත් කර ගැනීම් හා කුඹුරු ඉඩම් විකුණුම් | 22,303,786 | විස්තරාත්මක උපලේඛන |

**2.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති , රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| අ) 1975 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනතේ 45 (1) (ආ) (iii) ඡේදය | කොමිෂන් සභාව සඳහා අදාල විෂය භාර ජනාධිපති කාර්යාලය නියෝජනය කරන සාමාජිකයෙකු පත් කර නොතිබුණු අතර තවත් සාමාජික තනතුරක් පුරප්පාඩුව පැවතුනි. |

7

෮෦

ආ) <u>1971 අංක 38 දරන මුදල් පනත</u>

| | |
|---|---|
| i. 11 වන ඡේදය හා 2004 අගෝස්තු 10 දිනැති අංක පීඊඩී 25(1) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සභාවට ලැබෙන අතිරේක මුදල් ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කිරීමේදී අදාල මුදල් වර්ෂය ආරම්භයේ දී මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද සභාවේ රු.529,666,607 ක් කලින් කල ආයෝජනය කර තිබූ නමුත් එවැනි අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| ii. 13 වන වගන්තියේ 8 වන උපවගන්තිය | මුදල් පනතේ 13(7)(අ) ඡේදය පරිදි නිකුත්කල 2010 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ කරුණු සම්බන්ධයෙන් සභාව ගැනීමට යෝජිත පියවර වාර්තා කර නොතිබුණි. |

| | |
|---|---|
| ඇ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ පනතේ 02(1)(ඇ) ඡේදය | ඕනෑම ස්වභාවයකට අයත් සේවාවන් සැපයීමේ ව්‍යාපාරයක යෙදී සිටින ඕනෑම තැනැත්තෙකුගෙන් ජාතිය ගොඩනැගීමේ පනත ප්‍රකාරව බදු අය කල යුතු වුවද සභාව විසින් මෙම විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. |

ඇ) <u>1995 ජුලි 12 දිනැති අංක SEI/A/4/34 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛය</u>

| | |
|---|---|
| i. චක්‍රලේඛයේ 8 (අ) ඡේදය | සභාව සතු බදු ඉඩම්වල, බදු සංශෝධනයන්ට ලක්කල යුතු වුවද සභාව සතු බොහෝ ඉඩම් වසර 05 කට වරක් බදු සංශෝධනය කිරීමට කටයුතුකර නොතිබුණි. |
| ii. 8 (ආ) ඡේදය | බදු මුදල් ගෙවීම පැහැර හරින ලද ආයතන වල බද්ද අවසන් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. |
| iii. 8 (ඇ) ඡේදය | අදාල වගන්ති ප්‍රකාරව දීමනාකරුගේ අවසරයකින් තොරව අතුරු බදු දී තිබූ ඉඩම් පවරා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| ඉ) ආයතන සංග්‍රහයේ 9.1 වගන්තිය | අදාල විධිවිධාන ඉක්මවා වයස අවුරුදු 60 සම්පූර්ණවූ නිලධාරීන් දෙදෙනකු සේවයේ යොදවා |

| | |
|---|---|
| | සිටි අතර 2011 අප්‍රේල් 29 දිනැති අංක 60 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ඉහළ කළමණාකරණ ශ්‍රේණි වලට අයත් නිලධාරීන් විශ්‍රාමයාමේදී ඇතිවන පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු අනුප්‍රාප්තික සැලසුම් පිළියෙල කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. |
| ඊ) මුදල් රෙගුලාසි 502 (2) | එක් එක් ස්ථාවර වත්කම් විෂයට අදාලව එහි පිරිවැය, අත්පත් කරගත් දිනය, වාර්ෂික ක්ෂය ප්‍රතිපාතය, පිහිටීම ඇතුලත් ස්ථාවර වත්කම් ලේඛණ පවත්වා ගත යුතු නමුත් ස්ථාවර වත්කම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි. |
| උ) 2008 ජුනි 27 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියකින් තොරව බඳවා ගැනීම් සිදු නොකරන ලෙස දන්වා තිබුණද අනුමත කාර්යය මණ්ඩලයෙන් පරබාහිරව විධායක අධ්‍යක්ෂ, ඔප්පු උපදේශක තනතුරු සඳහා පුද්ගලයන් බඳවාගෙන තිබුණි. |
| ඌ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය 2011 ජනවාරි 27 දිනැති පිරිඩී 56 චක්‍රලේඛය | අදාල චක්‍රලේඛය ප්‍රකාරව සියළුම රාජ්‍ය ආයතන සිය මාස 6 ක කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ඉක්මවන අරමුදල් ප්‍රමාණය 2011 ජනවාරි 31 දිනට පෙර ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කල යුතු වුවද සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද ආදායම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුල කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු වල ශුද්ධ අතිරික්තය රු. 61,890,401 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,221,761ක් වූයෙන් අතිරික්තයේ වැඩිවීම රු. 51,668,640 ක් හෙවත් 505% ක් විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සැසදීමේදී ඉඩම් විකුණුම් ආදායම රු. 86,606,542 කින් ඉහල යාමත් ඉඩම් විකිණීම් හා අත්පත් පොලී ආදායම රු. 4,683,283 කින් හා විවිධ ආදායම රු. 7,597,136 කින් ඉහල යාමත් අතිරික්තය වැඩිවීමට හේතුවී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

අ) සභාවේ අවල ණයගැති ශේෂය රු. 2,137,647,805 ක් වූ අතර මෙය මුළු ජංගම වත්කම් වටිනාකමින් 93.79% ක් විය.

ආ) සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 1:19 ක් වූ අතර 2010 වර්ෂයේදි එය 1:21 ක් විය.

ඇ) පෙර වර්ෂයට සාපේක්ෂව ලැබිය යුතු ආදායම් 29% කින් අඩුවී තිබුණි.

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

අ) 2007 සැප්තැම්බර් 25 දිනැති පොදු චක්‍රලේඛයේ අඩු ආදායම්ලාභීන් සඳහා ඉඩම් විකිණීමේදී පර්චස් 01 කට රු. 100 ක් ගෙවිය යුතු වූවද 2011 පෙබරවාරි 25 දින මඩුවන්වෙල නින්දගම ඉඩමෙන් පුද්ගලයන් දෙදෙනෙකුට රු. 80 ක විකුණුම් වටිනාකමකට එක් අයෙකුට රූඩ් 03 පර්චස් 32.2 බැගින් ලබා දී තිබුණි.

ආ) ඉහත චක්‍රලේඛය ප්‍රකාරව විකිණීමෙන් එක් අයෙකුට පවරා දිය හැකි උපරිම ප්‍රමාණය ඉඩම් අක්කර 02ක් වුවත් අක්කර 02 රූඩ් 01 සිට අක්කර 50 ඉක්මවූ ප්‍රමාණයක් පුද්ගලයින් 5 දෙනකු වෙත සභාව විසින් පවරා දී තිබුණි.

## 3.4 දාශ්‍ය අක්‍රමිකතා / අවිධිමත් ගනුදෙනු

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආරක්ෂක අංශයක් තිබියදීත් එම ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන සභාවේ දිස්ත්‍රික් අධ්‍යක්ෂකවරයාගේ නිල කාමරයේ තිබූ ලිපි ගොනු හා මුදල් කුවිතාන්සි පොත් 2011 දෙසැම්බර් 20 දින සොරා ගෙන තිබුණු අතර මේ සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් පැවත්වීමට කටයුතු කර නොතිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්ය සාධනය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

අ) 2011 වර්ෂය සඳහා වූ ක්‍රියාත්මක සැලස්ම අනුව පිළියෙල කල කාර්ය සාධන වාර්තාව විගණනය වෙත ඉදිරිපත් නොවූයෙන් කාර්ය ඉටුකිරීමේ ප්‍රගතිය පිළිබඳ තහවුරු කරගත නොහැකි විය.

ආ) සභාව 2011 වර්ෂය සඳහා රැස් කර තිබූ බදු ආදායම රු.57,982,982 ක් වූ අතර ඉඩම් විකිණීම තුලින් ඉපයූ ආදායම රු.148,634,358 ක් විය. පෙර වර්ෂයට සාපේක්ෂව රු.2,618,949 කින් බදු ආදායම අඩුවී තිබුණු අතර ඉඩම් විකිණීමෙන් ලද ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.86,606,542 කින් හෙවත් 139.62 % කින් වැඩිවී තිබුණි.

### 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

බදු පදනම මත ඉඩම් ලබා දීම සම්බන්ධයෙන් විගණන නියැදි පරීක්ෂා සහ භෞතික පරීක්ෂා වලදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කුරුණෑගල දිස්ත්‍රික් බලමණ්ඩලයට අයත් ඉඩම් පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

i. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් බදු දී ඇති ඉඩම් කැබලි ප්‍රමාණය 95 ක් වූ අතර එයින් බදු අය නොවන ඉඩම් කැබලි සංඛ්‍යාව 74 ක් විය.

ii. ඉඩම් අක්කර 13 පර්චස් 30 ක් වූ ඉඩම් කැබලි 06 කට අදාල හිඟ බදු මුදල ඉඩම් 02ක අධිභාරයද සහිතව රු.3,731,131 ක් වූ අතර එම මුදල වර්ෂ ගණනාවක සිට හිඟ හිටව තිබුණි.

iii. ඉඩම් අක්කර 03 රූඩ් 03 පර්චස් 03 ක් වූ ඉඩම් කැබලි 02 ක් බදු ගත් සමාගම් විසින් සභාවේ අනුමැතියකින් තොරව අතුරු බදු දී තිබුණි.

(ආ) මාදම්පේ දිස්ත්‍රික් බලමණ්ඩලයට අයත් ඉඩම් පිළිබඳ පරීක්ෂණයේදී පහත කරුණු නිරීක්ෂණය විය.

i. දිස්ත්‍රික් කාර්යාලයේ ඉඩම් ලිපිගොනු පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

| | අක්කර | රූඩ් | පර්චස් |
|---|---|---|---|
| අනවසර පදිංචිකරුවන් භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය | 5765 | 02 | 04 |
| අනවසර වගාවන් සඳහා යොදා ගැනීම් | 1312 | 02 | 33 |
| සභාවට පැවරී ඇති නමුත් අයිතිය තහවුරුකර නොගැනීම | 4134 | 02 | 27 |
| පදිංචිය සනාථ නොකල පුද්ගලයන්ට ඉඩම් වල සින්නක්කර අයිතිය පැවරීම | 724 | 03 | 02 |
| ව්‍යවස්ථාපිත නිශ්චය ලබා නොදීම | 583 | - | - |
| ඉඩම් සම්බන්ධ ලිපිගොනු පවත්වා නොතිබීම | 1078 | - | 14 |
| ප්‍රමාණවත් තොරතුරු නොමැති ලිපිගොනු | 1191 | 02 | 25 |
| | --------- | ---- | ----- |
| එකතුව | 14,787 | 11 | 105 |

ii. කුඹුටුකුලියවත්ත ඉඩමට අදාල අක්කර 74 ක් බදු දීම සම්බන්ධයෙන් හිඟ බදු මුදල රු.6,525,000 ක් වූ අතර, ඊට අදාල අධිභාරය වූ රු.2,020,000 ක වටිනාකම නිසි අනුමැතියකින් තොරව කොමිෂන් සභා තීරණය මත කපාහැර තිබුණු බව නිරීක්ෂණය විය.

iii. කුඹුටුකුලියවත්ත ඉඩමෙන් හෙක්ටයාර 8.094 ක් සඳහා බදු සංශෝධනය කර නොතිබූ අතර කාරණාව වත්තේ අක්කර 01 රූඩ් 02 ක් සඳහා හිඟ බදු මුදල් වශයෙන් රු.598,200 ක් අයවිය යුතුව තිබුණි.

(ඇ) මහනුවර දිස්ත්‍රික් බලමණ්ඩලයට අයත් ඉඩම් පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

i. විගණනයේ නියැදි පරීක්ෂාවකදී පහත කරුණු අනාවරණය වූ අතර ඒ සඳහා සභාව ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

| | අක්කර | රූඩ් | පර්චස් |
|---|---|---|---|
| නීත්‍යානුකූලව බදු දී නොමැති | 54 | 03 | 23 |
| හිඟබදු අයවිය යුතු (රු.3,879,811) | 02 | 02 | 24 |
| අනවසර පදිංචිකරුවන් සිටින ඉඩම් | 139 | 01 | 02 |
| අතුරු බදු දීම් | 41 | - | - |
| ඛනිජ සම්පත් අනවසරයෙන් භුක්ති විඳින | 55 | - | - |
| | ----- | ----- | ---- |
| එකතුව | 291 | 06 | 49 |

ii. පවතින ඉඩම් ලේඛනයට අනුව සභාවට පැවරුනු ඉඩම් වලින් සැලකිය යුතු ප්‍රමාණයක් සඳහා ලිපි ගොනු බලමණ්ඩලය සතුව නොතිබුණි.

iii. සභාව සතු ඉඩම් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට හා ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවට පවරාදීමෙන් පසු සමහර ඉඩම් නැවත අත්පත් කරගෙන ඇතත් ඒ පිළිබඳ ප්‍රමාණවත් විස්තර සභාව සතුව නොතිබුණි.

iv. <u>අම්බලමානවත්ත ඉඩම (වපසරිය අක්කර 576 රූඩ් 01 පර්චස් 26)</u>

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ කොමිෂන් සභාව වෙත අයිතිය පැවරී තිබුණු ඉහත වතුයාය කළමනාකරණය කිරීම සඳහා 1988 අගෝස්තු 05 දින ජනතා වතු සංවර්ධන මණ්ඩලයට පවරා දී නැවත 2000 ජනවාරි 21 දින කොමිෂන් සභාව වෙත පවරාගෙන තිබුණි. ඒ සම්බන්ධ වූ නිරීක්ෂණ පහත දැක්වේ.

ආ) උක්ත ඉඩමේ අක්කර 217 පර්චස් 17 ක ප්‍රමාණයක් නිසි පරිදි හිමිකම තහවුරු කර ගෙන නොතිබුණි.

ආ) කොමිෂන් සභාව වෙත පවරාගෙන තිබුණු නමුත් ව්‍යවස්ථාපිත නිශ්චය මත ආපසු පවරා දිය යුතු අක්කර 89 රූඩ් 2 පර්චස් 1ක කොටසින් අක්කර 25 ක ප්‍රමාණයක් සාධාරණ පදනමකින් තොරව බාහිර පාර්ශවයක් (සමාගමක්) වෙත බදු දී තිබුණි.

ඇ) සිලිකා වැනි වටිනා ඛනිජ සම්පත් භූගතව විසිර ඇතැයි සැලකෙන අක්කර 10 ක ඉඩම් ප්‍රමාණයක්

(1) ඛනිජ සම්පත් බදු දීම පිළිබඳ විධිවිධාන නොසලකමින්

(2) නිසි ගිවිසුමක් නොමැතිව

13

67

(3) පරිසර බලපත්‍රයක් නොමැතිව හා රජය සතු සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම වලක්වමින් සමාගමකට භුක්ති විදීමට සලසා තිබුණි.

ඇ) මෙම ඉඩම ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් නැවත පවරා ගැනීමේදී වතු කම්කරුවන් 184 දෙනකුට පර්චස් 40 බැගින් ලබා දී ඇතත් ඔවුන්ගෙන් 166 දෙනෙක් සඳහා අදාල ගාස්තු අයකර ඔප්පු ලබා දී නොතිබුණි.

4.3 හඳුනා ගන්නා ලද පාඩු

පරිගණක මෘදුකාංග පැකේජයක් ලබා ගැනීම වෙනුවෙන් 2007 වර්ෂයේදී ගෙවූ රු. 1,700,000 ක මුදලක් 2011 දෙසැම්බර් 31 දින දක්වාත් අත්තිකාරම් ලෙස ගිණුම් ගත කර තිබුණි. මෙම ගෙවීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයක් පැවැත්වෙන බව විගණනයේදී අනාවරණය වූ අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල කිසිදු හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

අ) 1995 අප්‍රේල් 24 දිනැති භාණ්ඩාගාර ලිපිය අනුව සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 190 ක් වුවද 2011 දෙසැම්බර් 01 දිනට සත්‍ය සේවක සංඛ්‍යාව 404 ක් විය. ඒ අනුව අතිරික්ත සේවක සංඛ්‍යාව 214 ක් වූ අතර මෙම අතිරික්ත සේවකයන් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කිරීම සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුවේ අනුමැතිය සමාලෝචිත වර්ෂය අවසානය තෙක් ලැබී නොතිබුණි.

ආ) අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු තනතුරු 63 ක් පැවතුනි.

4.5 වාහන උපයෝජනය

2011 වර්ෂයේ සිදුවූ වාහන අනතුරු 02 ක් සම්බන්ධයෙන් මු.රෙ. 104 (3) ප්‍රකාරව ප්‍රාථමික වාර්තා හෝ අවසාන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2011 - 2015 වර්ෂ සඳහා සභාව සංයුක්ත සැලැස්මක් සකස්කර තිබූ නමුත් 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන චක්‍රලේඛයේ විධිවිධාන සැලකිල්ලට ගෙන නොතිබුණි. ආදායම් හා වියදම් 2011 හා 2012 වර්ෂ සඳහා පමණක් පුරෝකථනය කර තිබුණු අතර අදාල උපාය මාර්ග සැලසුම් සඳහා වගකීම බෙදී යන ආකාරය නිවැරදිව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. එමෙන්ම ,ඇතැම් අරමුණු හා ඊට අදාල උපාය මාර්ගයන් ක්‍රියාත්මක කිරීමේ වගකීම පාර්ශවයන් කිහිපයක් දැරිය යුතු යුතු බවට දක්වා තිබුණද , එක් එක් පාර්ශවය අතර වගකීම බෙදී යන ආකාරය නිවැරදිව පෙන්වා නොතිබුණි.

### 5.2 ක්‍රියාකාර සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

අ) ප්‍රතිපත්ති හා නිතීරීති අනුව සුදුසු පුද්ගලයන්ට හා ආයතන වලට විකිණීම හෝ බදු පදනම මත පවරා දීම සඳහා නිලධාරීන් වෙත වගකීම පවරා තිබුණද වර්ෂය තුල සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්ක ක්‍රියාත්මක සැලසුමේ ඇතුලත් කර නොතිබුණි.

ආ) ආයතනික සංවර්ධන වැඩ සටහන් හා ඵලදායිතා වැඩ සටහන් 36 ක් සැලසුම් කර තිබුණද එහි කාල වකවානු සඳහන් කර නොතිබුණ අතර. මානව සම්පත් කළමනාකරණයට අදාලව ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබූ නමුත් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම්, පුහුණු කිරීම් හා සංවර්ධනය යටතේ සපුරාලියයුතු ඉලක්කයන් සඳහන් කර ඊට අදාල කාල වකවානු දක්වා නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

සභාවේ 2007 පෙබරවාරි 27 දින සිට ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පවතින අතර 2011 වර්ෂය සඳහා දිස්ත්‍රික් බලමණ්ඩල ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය මෙහෙයවීමට සැලසුම් කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 5.4 විගණන හා කළමනාකරණ කමිටු

සභාව ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ පවතින නමුත් එහි නියෝජිතයෙකු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සාමාජිකයෙකු ලෙස සහභාගි වී නොතිබුණි.

## 5.5 අයවැය පාලනය

2011 වර්ෂයේ අයවැය ගත ආදායම් වියදම් සත්‍ය ආදායම් වියදම් සමඟ සැසඳීමේදී 25% සිට 1984% දක්වා විචලනයන් අනාවරණය වූ හෙයින් එය කාර්යක්ෂම කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනය

පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරවා ඇති අතර, පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

අ) ආදායම් අංශ වාර්තා හා ගිණුම් අංශයේ ආදායම් වාර්තා
ආ) මුදල් පිළිබඳ පාලනය
ඇ) නිවාඩු ලේඛනය හා පැමිණීමේ ලේඛනය
ඈ) ඉදිරි වැඩසටහන් හා කලවැඩ වාර්තා
ඉ) දිස්ත්‍රික් බලමණ්ඩල ඉඩම් ලේඛන
ඊ) ඉඩම් ලිපිගොනු පවත්වා ගැනීම හා ගබඩා කිරීම
උ) යාවත්කාලීන කරන ලද බදු ලේඛනය, විකුණන ලද හා ඉතිරි ඉඩම් ප්‍රමාණයන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුලත් ලේඛන
ඌ) ඉඩම්වල බලහත්කාරයෙන් හා අනවසරයෙන් පදිංචිවීම් පිළිබඳ ප්‍රමාණවත් වාර්තා

එච් .ඒ .එස්. සමරවීර
විගණකාධිපති

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව
<u>බත්තරමුල්ල</u>

**<u>ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.</u>**

ශීර්ෂගත කරුණට අදාලව නියෝජ්‍ය විගණකාධිපති විසින් මා වෙත යොමුකරන ලද සමාංක හා 2012.08.09 දිනැති විගණකාධිපති වාර්තාව හා බැඳේ.
එකී වාර්තාවෙන් විමසීමෙන් කරන ලද ගැටළු සම්බන්ධයෙන් පිළිතුරු පහත සඳහන් පරිදි වේ.

**2.2. <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

**2.2.1 <u>ශ්‍රී ලංකා ගිනුම්කරන ප්‍රමිත</u>**

I **<u>ගිණුම්කරණ ප්‍රමිත අංක 03</u>**

නිලධාරීන් සේවයෙන් ඉවත්වී යාමෙන් පසු අදාළ මූලික කොන්දේසි සපුරා තිබේනම් එම පාරිතෝෂික මුදල් මාසයක් ඇතුලත ගෙවා නිම කළයුතුවේ. ඒ අනුව එම වෙන්කිරීම ජංගම වගකීම යටතේ දක්වා ඇති අතර, 2011 වසරේද මෙය මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට උපදෙස් ලබාදුන්න ද එය ගිණුම්වල සටහන් කිරීමට නොහැකිවී ඇති බැවින්, ඉදිරියේදී අනිවාර්යයෙන්ම ගිනුම්වල ගැලපීම් සිදු කිරීමට සටහන් කර ගන්නා ලද අතර අදාළ නිලධාරීන්ට අවවාද කරන ලදී.

II **<u>ගිණුම්කරණ ප්‍රමිත අංක 16</u>**

සාමාන්‍යයෙන් පාරිතෝෂික ගෙවීම සිදු කරනු ලබන්නේ පුනරාවර්තන ගිණුමේ මුදල් වලිනි. පාරිතෝෂික වෙනුවෙන්ම පවත්වාගෙන යනු ලබන මිලියන 5 ක ආයෝජනයක් ද අප සතුව පවතින අතර, ඒ සඳහා වෙන්කිරීම් වලට අදාළ මුදල් ද ඇතුලුව සියළුම අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත. කෙසේ වෙතත් ඉදිරියේ නිදන් අරමුදලෙන් අදාළ පාරිතෝෂිත ගෙවීමට උපදෙස් දෙන ලදී.

III **<u>ගිණුම්කරණ ප්‍රමිත අංක 18</u>**

i කොමිසන් සභාවේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේදී වත්කම් වල ඵලදායි ජීවකාලය, පිරිවැය යනාදිය සැලකිල්ලට ගෙන ඇති ස්ථාවර වත්කම්වල තිබෙන්නාවූ ඇතැම් පැරණි වත්කම් වල තොරතුරු නොමැති බැවින්, ඒවායේ සුත්බුත් අගය ගැලපීම අපහසු වී ඇත.

ii අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් තක්සේරු කමිටුවක් පත්කර දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාල ආවරණය වන ලෙස නැවත වත්කම ප්‍රත්‍යාගණය කර පොත්වල ගැලපීමට අවශ්‍ය කටයුතු දැනට සිදුකරමින් පවතී.

IV **<u>ගිණුම්කරණ ප්‍රමිත අංක 36</u>**

කොමිසන් සභාවේ පවතින නඩුවල තීරණ ලැබෙන කාලය නිශ්චිතවම කිව නොහැකි බැවින්, හා සමහර නඩු ගෙවීමකින් තොරව අවසන් වන අවස්ථා තිබෙන බැවින්ද, මේ සම්බන්ධතා වෙන්කිරීම කළ නොහැක. ඊට අමතරව අලුතෙන් එකතුවන නඩු ප්‍රමාණය නිශ්චිතවම කිව නොහැකි අතර, ඇතැම් නඩු සම්බන්ධව එකවර ගෙවීම් කර තිබීම නිසා වෙන්කිරීම් කළ නොහැකි තත්ත්වයට පත්වී ඇත. 2012 වසරට අදාළ ගිණුම් වල සටහනක් වශයෙන් ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදී.

V **ගිණුම්කරණ ප්‍රමිත අංක 40**

විකුණනු ලබන ඉඩම් වලට අදාළ ඉඩම් ගැලපීම් සිදු කිරීමට නොහැකි වී ඇති බැවින්, මූල්‍ය ප්‍රකාශන තුල ජංගම නොවන වත්කම් යටතේ ඉඩම පෙන්නුම් කර ඇත. ඉඩම් ලේඛණය සකස් කිරීම් කර අවසන් වූ පසු විකුණනු ලැබූ ඉඩම් වලට අදාළ පිරිවැය ඉවත් කර ඉතිරි ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශන වල ආයෝජන දේපල ලෙස පෙන්නුම් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදි. දැනට මෙය ආදර්ශ ව්‍යාපෘතියක් වශයෙන් මාතලේ දිස්ත්‍රික්කය පාදන කොටගෙන ක්‍රියාත්මක කිරීමට සැළසුම් කරඇත.

VI **ගිණුම්කරණ ප්‍රමිත අංක 41**

ඉදිරියේදී වත්කම් ප්‍රත්‍යාගනය කර ගිනුම්වල ගැලපීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට සැලසුම්කර ඇත.

2.2.2. **ගිනුම්කරණ ප්‍රතිපත්ති**

I කොම්පත් සභාවේ ගිණුම් තැබීම සඳහා වර්ථමානයේ උපචිත පදනම අනුගමනය කරනු ලැබේ.

II කොම්පත් සභා ගාස්තු සහ මැනුම් ගාස්තු ආදායම අයිතම් දෙකම විවිධ ආදායම යටතේ වර්ග කර ඇත. ඉදිරියේදී මැණුම් ගාස්තු වෙනම අයිතම්ගත කිරීමට සටහන් කර ගන්නා ලදි.

111 2007 වර්ෂයේදී මේ සඳහා පොදු අනුමැතියක් ලබාගෙන ඇත.

2.2.3. **ගිනුම්කරණ අඩුපාඩු**

I. ඉවත් කරන ලද ජායා පිටපත් යන්ත්‍රයේ පිරිවැය සහ ඊට අදාල සමුච්චිත ක්ෂය කොපමණ ද යන්නත්, තොරතුරු ලබාගත නොහැකිවීමත්, එම යන්ත්‍රය ඉතා පැරණි බැවින්, සම්පූර්ණ ක්ෂය වී ඇතැයි උපකල්පනය කර සම්පූර්ණ හුවමාරු වටිනාකම ලාභය ලෙස සලකා ගිනුම්ගත කර ඇත.

II. 2009 වර්ෂයේ ආරම්භක ශේෂයන්ගෙන් සමන්විතව 2009 සිට අද දක්වා කාල පරිච්ඡේදය තුල මිළදීගත් වත්කම සඳහා පිරිවැය මිළදීගත් දිනය හා ක්ෂය අනුපාතය සඳහන් කරමින් ලේඛණයක් පවත්වාගෙන යනු ලැබේ. එය විගණය සඳහා ඉදිරිපත් කළ හැක.

111 අනුරාධපුර,හම්බන්තොට දෙසැම්බර් මස ඉඩම් විකුණුම් ආදායම එම මාසය තුලම ගිණුමට මාරුවී නොමැති බැවින් 2012 වසරේ ජනවාරි ගිණුම්වල ඇතුලත් කර ඇත. ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේ මාර්තු මස රු.99753/- සහ අප්‍රේල් මස රු.32288/- යන දෙකෙහි එකතුව මැයි මස රු.132041/- ලෙජරයට පිටපත්කර ඇත.

IV (අ)

- i හාණ්ඩාගාර බිල්පත් ආයෝජන වටිනාකම 2011.03.30 දිනට රු. 29,735,671/- ක් වේ. එය 2011 ගිනුමෙන් 30,310,452/- ක් වියයුතු අතර, එහි නව ආයෝජන වටිනාකම වන රු. 574,781/- ක මුදල 2012 වර්ෂයේ අවසාන ගිණුම් පිලියෙල කිරිමේදී නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදි.
- ii 2011 වසරට අදාළව පොලී මුදල් ලැබී තිබියදීත්, එය ලැබිය යුතු ආදායම් ලෙස ප්‍රමාද දෝශයකින් සටහන් වී තිබීම හේතුවෙන් මෙරට පොලී ආදායම වැඩියෙන් ගිනුම්ගත වී ඇත. මෙය 2012 වසරේදී නිවැරදි කිරිමට උපදෙස් දෙන ලදි.
- iii 2011 මාර්තු 11 සිට 2012 මාර්තු 09 දින දක්වා කාලයට අදාළ හාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම 1455 ගිනුමට බැර වී තිබුණත්, ප්‍රමාද දෝශයකින් නැවත එම මුදල ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගතවී ඇත.
  මෙය 2012 වසරේදී නිවැරදි කිරිමට සටහන් කරගන්නා ලදි.

(ආ) **ස්ථාවර තැන්පතු අංක 219702**

i 2011 වර්ෂයට අදාළව ස්ථාවර තැන්පතුවල වාර්ෂික පොලිය අළුත්කිරීමේ වාර්තාව ලැබුණ නිසා, ස්ථාවර තැන්පත් ගිනුම් අංක 219702 දරණ තැන්පතුවට අදාළව රු. 3,197,825/- ක් අඩුවෙන් සටහන් වී ඇත. එය 2012 වසරේදී නිවැරදි කිරීමට සටහන් කරගන්නා ලදී.

ii ඉහත i අනුව සිදුවූ මගහැරීම හේතුවෙන් එයට අදාළ වූ 2011 සැප්තැම්බර් 01 දිනට කල්පිරෙන වටිනාකමට අදාළ පොලිය ද ගිනුම්ගත කිරීම මගහැර ඇත. එය 2012 වර්ෂයේදී ගැළපීම සටහන් කර ගතිමි.

iii 2011 වසරට අදාළව කලින් ලද ස්ථාවර තැන්පත් පොලී ආදායම රු. 2,458,226/- ක් වැඩියෙන් ප්‍රමාද දෝශයකින් ගිණුම්ගත වී ඇති අතර, 2012 වසරේදී නිවැරදි කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී.

iv වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු ආදායම ගිනුම්ගත නොවීම හේතුවෙන් ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය ගිණුම් වලින් මගහැරීම හේතුවෙන් මෙසේ අඩුවෙන් පෙන්නුම් වීම 2012 වසරේ නිවැරදි කර ගැනීමටට සටහන් කර ගැනීම.

v 2011 වසරට අදාළව රඳවා ගැනීමේ බදු වටිනාකම රු. 122,055/- ක් වැඩියෙන් දැක්වීමක් සිදුවී නොමැති අතර, වාර්ෂික අලුත් කිරීමේ නිවේදනය නියමිත දිනට නොලැබීම මත සම්පූර්ණ රඳවාගැනීමේ බදු ගැලපුම ගිණුම්වලින් මගහැරී ඇති බැවින් 2012 වසරේදී ගිණුම්වල ගැලපීමට සටහන් කර ගන්නා ලදී.

භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු පොලී ආදායම් පිළිබඳව ඉදිරිපත්කර ඇති විමසුම් යම් ගැටළු සහගත තත්වයක් පවතින බැවින් විගණකයන් සමග සාකච්ඡාකර සුදුසු පියවර ගන්නා ලෙසට මුදල් අංශයට උපදෙස් ලබාදෙන ලදී.

(ඇ) **සේවක පාරිතෝෂික**

i පාරිතෝෂික ගණනය කිරීමේදී සේවයෙන් ඉවත් වූ සහ වැඩ තහනමකට ලක්ව ඇති සේවකයින් වෙනුවෙන් ද ප්‍රමාද දෝෂයකින් පාරිතෝෂික වෙන්කිරීම හේතුවෙන් 2011 වර්ෂයේ පාරිතෝෂික වෙන්කිරීම වැඩිපුර ගණනය වී ඇත. පාරිතෝෂික වෙන් කිරීම කාලයක් තිස්සසේ සිදුවී ඇති මෙවැනි දෝෂ ඉදිරියේදී සිදු නොවීමට වග බලා ගන්නා ලෙසට අදාළ අංශවලට අවවාද කරන ලදී.

ii පාරිතෝෂික වෙන් කිරීමේදී සේවකයින්ගේ මූලික වැටුපට අදාළ පාරිතෝෂික වෙන්කරනු ලැබේ. එසේ මූලික වැටුප සහ සේවා කාලයෙහි වෙනස්කම් මේ වෙනසට හේතු වී ඇති අතර, ඉදිරියේදී පාරිතෝෂික වෙන්කිරීම් වලට අදාළව සියළුම විස්තර යාවත්කාලීන කර ගිණුම්වල ගැලපීමට උපදෙස් ලබා දෙන ලදී.

iii සේවයෙන් ඉවත්ව ගිය සේවකයින්ද දැනට සේවයේ සිටින සේවකයින්ද එකම ලැයිස්තුවකට ඇතුලත්ව පාරිතෝෂික ගණනය කිරීම් සිදුවන බැවින්, ඉදිරියේදී ලැයිස්තු දෙකක් යටටතේ මෙය සකස් කරන ලෙස ගිණුම් අංශයට උපදෙස් ලබා දෙන ලදී.

1V. 2011 වසරට අදාළ පාරිතෝෂිත ගණනය කිරීමේදී වැටුප් වර්ධක නොසලකාහැර ඇත. 2012 වසර තුළ වැටුප් වර්ධක ඇතුළත් කර පාරිතෝෂික වෙන් කිරීම නිවැරදිව ගණනය කිරීමට අදාළ අංශ වෙත උපදෙස් දෙන ලදී.

V. මෙය කොම්පත් සභා සාමාජික දීමනා වශයෙන් දක්වා ඇති ප්‍රමාණයකි. ව්‍යාපෘති කමිටු සාමාජිකයින්ට ගෙවන දීමනාද, විගණන හා කළමණාකරණ කමිටු සාමාජිකයින්ට ගෙවනු ලබන දීමනා ද ඇතුළත් වේ. මේ අනුව කොම්පත් සාමාජිකයින්ට වැඩිපුර ගෙවූ දීමනාවක් නොව අවස්ථා **3** කට අදාළව ගෙවීම් වල එකතුවක් වන අතර, ඉදිරියේදී ගිනුම් වල අයිතම් **3** ක් යටතේ පෙන්නුම් කිරීමට සටහන් කරගන්නා ලදී.

VI නුවර, කළුතර, ඇඹිලිපිටිය, කොළඹ යන දිස්ත්‍රික් කාර්යාල සඳහා ගෙවිය යුතු ගෙවල්කුලිය ප්‍රමාද දෝෂයකින් අඩුවෙන් ගිණුම්ගත වී ඇත. මාතර දිස්ත්‍රික් කාර්යාලය

පවත්වාගෙන යන ගොඩනැගිල්ල වෙනුවෙන් හිමිකරු විසින් ඉල්ලා තිබූ බදු කුලියට එකගවීමට නොහැකි වීම මත නැවත තක්සේරුවක් කැඳවා බදු ගිවිසුම් වලට 2011 වසර තුල එළඹීමට නොහැකිවීම මත මාතර කාර්යාලය වෙනුවෙන් 2011 වසරට අදාල ගෙවිය යුතු බදු මුදල ද ගිණුම් ගත නොවිණි. ප්‍රධාන කාර්යාලීය බදු කුලිය රු. 330,000/- ලෙස රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් දන්වා තිබුණද , කලින් වසරට අදාලව රු. 280,000/- පොත්වල ගැලපීම මත ගෙවිය යුතු බදු කුලිය අඩුවෙන් ගිණුම්ගත වී ඇත. ඉදිරියට ගෙවූ ගෙවල්කුලී ලෙස බදුල්ල දිස්ත්‍රික් කාර්යාලයට රු.20,000/- ක් ද , අනුරාධපුර කාර්යාලය වෙනුවෙන් මාස 1, 1/2 ක් වෙනුවෙන් ගෙවූ රු.19,500/- ක් ඇතුළුව එකතුව රු.39,500/- ක් ගෙවා ඇත. එය රු.46,000/ ක් නොවන බවත් දන්වමි. 2011 වසරට අදාළ හිග ගෙවල්කුලිය සහ ඉදිරියට ගෙවූ ගෙවල්කුලිය දැනටමත් 2012 වසර තුළ ගිණුම් පොත් වලට අදාල ගැලපීම සිදු කර ඇත.

VII නොවැම්බර් මස බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලයේ ඉඩම් විකුණුම් ආදායම රු.314,699/- ක් විය යුතු වුවත්, එය රු.344,699/- ක් ලෙස මුදල් පොතේ ලැබීම් පැත්තේ සටහන් වීම මත මුදල් පොතේ ශේෂය රු.30,000/- ක් වැඩියෙන් සටහන්වීම හා ඒ අනුව ඉඩම් විකුණුම් ආදායම රු.30,000/- කින් වැඩිවී ඇත. මුදල් පොතේ නිවැරදි ශේෂය රු.22,326,729/- ක් බවද සඳහන් කරමි. මෙවැනි වැරදි වලක්වා ගතයුතු බවට අවවාද කල අතර, 2012 වසරේ මෙය ගැලපුම් කිරීමට අවශ්‍ය උපදෙස් දෙන ලදී.

### 2.2.4 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

I කල්බදු පදනම මත මිලදීගත් කැබ්රථ 3 ට අදාලව ගිණුම් පොත් වල අදාළ ගැලපීම නිවැරදිව සිදු කලද, ජර්නල් සටහන් වලට අදාළ රථ 3 ට අදාළ පිරිවැය ස්ථාවර වත්කම් ලේඛණයේ අදාළ ලෙජර් පිටුවට ගෙන ගොස් නැත. මේ අනුව ස්ථාවර වත්කම් ලේඛණ පිටු අංක 3, 7 සහ 8 පිටුවල මෙම වරද නිවැරදි කර ඇත.

II ණය ලෙජරය සහ ණය ලේඛනය විස්තරාත්මක ලෙස පරික්ෂාකර මෙම වරද නිවැරදි කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් ලබාදෙන ලදී.

111 අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය තුල සිදුවූ මුදල් අක්‍රමිකතාවක් හේතුවෙන් අධ්‍යක්ෂවරයා ඇතුළුව නිලධාරීන් 4 දෙනෙකුගේ වැඩ තහනමට ලක්විය. මෙම හේතුව නිසා 2011 ජුනි මාසයේ සිට ආදායම් විස්තර ලබාගෙන බැංකු අතර, මාරු කිරීමට නොහැකි විය. ඊට හේතුවූයේ ආදායම් විස්තර වලට අදාළ රිසිට්පත් විමර්ශන කටයුතු සඳහා ලබාගෙන තිබීම නිසා බව නිලධාරීන් විසින් අප වෙත දැනුම් දී තිබුණි. ඒ අනුව ජුනි මස ඉඩම් විකුණුම් ආදායම රු. 23,300/- සහ ජූලි මස රු. 28,305/- යන වටිනාකමේ එකතුව වූ රු. 51,605/- සැප්තැම්බර් ගිණුමට බැර කරන ලදී.

නුවරඑලිය දිස්ත්‍රික්කයේ දෙසැම්බර් මස ආදායම දෙසැම්බර් 28 දින ඉඩම් විකුණුම රු. 196734, මුද්දර රු. 6833/- නීති ගාස්තු රු. 15,900/- ඇතුළුව රු. 219507 ගිණුමට බැර වී ඇත. මේ අනුව මුදල් පොතෙන් ලෙජරයට පිටපත් කිරීමේදී 196774 වෙනුවට 196574 ක් ලෙස සටහන් වී ඇත. මෙය ගිණුම් සටහන් කිරීමේ වරදක් වන අතර, ඉදිරියේදී මෙවැනි කටයුතු සඳහා වැඩි අවධානමක් යොමු කරන ලෙස අවවාද කරන ලදී.

හම්බන්තොට දිස්ත්‍රික් බල මණ්ඩලයේ පෙබරවාරි මස ඉඩම් විකිණීම් ආදායම රු. 273,250/- ලෙස සටහන් වී ඇත්තේ එහි 10% ක අධිභාරය වූ රු. 20,000/- ක් මුදල ඉඩම් විකුණුම් ආදායම් ලෙස සටහන්කර ඇති නිසාය.

බදුල්ල දිස්ත්‍රික් බල මණ්ඩලයේ ආදායම් වාර්තාවට අනුව රු. 314,699/- ක් ලෙස ආදායම සටහන් කර ඇත. එය ලෙජරයේ පිටපත් කරන විට රු. 344,699/- ක් ලෙස වැරදීමකින් සටහන් කර ඇත. එය ඉදිරියේදී නිවැරදි කර ගැනීමට උපදෙස් දෙන ලදී.

මැයි මස කුඹුරු විකුණුම් ආදායම රු. 3200/- ක් සහ ජූලි මස 10,700/- යන දෙකෙහිම එකතුව රු. 13900/- ලෙස අගෝස්තු මාසයේ ගිනුම්ගත වී ඇත.

IV ස්ථාවාර තැන්පතු සඳහා ලැබිය යුතු පොලිය එකතු කිරීමේදී මෙම වරද සිදුවී ඇති අතර, 2012 වසර තුළ මෙය නිවැරදි කිරිමට සටහන් කරගන්නා ලදී.

**2.2.5 <u>පැහැදිලි නොකල වෙනස්කම්</u>**

I බැංකුව මගින් ලබාදුන් ශේෂ සනාථ කිරීමේ ලිපියේ පිටපතක් ලබාගෙන බැංකුව සමග සාකච්ජා කර ඉදිරියේදී පිළිතුරු ලබාදීමට බලාපොරොත්තු වෙමි.

II සියළුම දිස්ත්‍රික් කාර්යාල වලට අදාලව සහ ප්‍රධාන කාර්යාලයට ලැබෙන ඉඩම් විකුණුම්, ඉඩම් විකුණුම් ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර ඇත. ආදායම් අංශයේ ආදායම් සහ මුදල් අංශයේ ආදායම වූ රු. 13,536,111/- පිළිබඳ වාර්තාවක් ඉදිරියේදී ලබාදීමට බලාපොරොත්තු වෙමි.

III 1972 සිට අප විසින් පරිහරණය කරනු ලබන මෙම ගොඩනැගිලි සඳහා මුලදී ගෙවිය යුතු බදුකුලිය රු.1400 හා රු. 14000/- වැනි ඉතා අඩු අගයක සිට එකවර රු. 280,000/-, රු. 330,000/- වැනි මුදලකට වැඩිකර ඇත. එකවර විශාල ප්‍රමාණයකින් බදු මුදල් වැඩිකිරීම අප ආයතනයට දැරීමට අපහසු බැවින්, එම මුදල අඩු කිරීමට සහ මෙම ගොඩනැගිල්ල ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පවරා ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමග සාකච්ජා වට කිහිපයක් පැවැත්වූ බැවින්, මෙම වටිනාකම ගිනුම්වලට අදාලව ගැලපීම් කර හෝ බදු කුලියද ගෙවා නැත.

**2.2.6. <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

I ජනාධිපති ලේකම් තුමා හා රජයේ ආයතන නිලධාරීන් සමග සාකච්ජාකර ණය අයකර ගැනීමට පියවර ගනිමින් පවතී.

II අදාල ශේෂ සනාථ නොකරන ආයතන රජයේ විගණන අංශයෙන් විමසා ඒ සඳහා නීතිමය පියවර ගැනීමට සටහන්කර ගන්නා ලදී.

III මේ සම්බන්ධව විගණන විමසුමක් හෝ ඉදිරිපත්කර ඇති තොරතුරු ප්‍රමාණවත් නොවන නිසා , විගණකයින් සමග සාකච්ජාකර අදාළ තොරතුරු ලබාගෙන ඒ අනුව පියවර ගැනීමට ක්‍රියාකරමි.

IV මෙම නිලධාරීන්ගෙන් සමහරක් නිලධාරීන් වැඩ තහනම් කිරීම ආදී නීතිමය ක්‍රියාමාර්ග හේතුවෙන් පාරිතෝෂික මුදල් ද ලබාගෙන නොමැති බැවින්, එම නීතිමය ක්‍රියාමාර්ග අවසන් වීමෙන් පසු අදාල පාරිතෝෂික ගෙවීම් තුලින් මෙම ණය වාරික මුදල් අයකරගනු ලැබේ. ණය ගෙවීම් පැහැරහැර ඇති පුද්ගලයින්ගෙන්(මෙයින් සමහර පුද්ගලයින් මිය ගොස් ඇති බව වාර්තාවී ඇත) එය අඩුකර ගැනීමට ඔවුන් වෙත අවස්ථා කීපයකදීම ලිඛිතව දැණුම් දී ඇත. තවද මේ සම්බන්ධ ඇපකරුවන් ද දැනට සොයාගත නොහැකි තත්වයක පවතී. 2011 වසරේ අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරීන් දෙනෙකු වැඩ තහනමකට ලක්වූ බැවින් , ඔවුන්ගෙන් ණය අයකර ගැනීමට නොහැකි විය. දැනට ඔවුන් නැවත සේවයේ පිහිටුවා ඇති බැවින්, සාමාන්‍ය පරිදි ණය අයකරනු ලැබේ. පවතින තොරතුරු හා ඇපකාරයින් පිළිබඳවද සොයා බලා අදාල ණය මුදල් අයකර ගැනීමට උපරිම පියවර ගන්නා ලෙස උපදෙස් දී ඇත. වර්තමානයේ මෙවැනි තත්වයන් ඇති නොවීමේ ක්‍රම වේදයන් ණය ලබාදීමේදී අනුගමනය කරනු ලැබේ.

V 2002-2004 කාලය තුළ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් තහනම් කරන ලද මෙම ඉඩම් ගනු දෙනුව, එකී ආයතන හා පුද්ගලයින් විසින් නැවත කරන ලද ඉල්ලීම අනුව කොමිෂන් සභාව මගින්, විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන්නට යෙදුනි. එහිදී අමාත්‍ය මණ්ඩලය විසින් තහනම් කරනු ලැබූ මෙම ඉඩම් ගනු දෙනුවට අයත් ඉඩම් නැවත පවරාදීමට ක්‍රියා කරන්නේ නම්, ඒ සඳහා සංශෝධන සහිත කැබිනට් පත්‍රිකාවක් සකසා ඉදිරිපත් කළයුතු බව ජානාධිපති ලේකම් කාර්යාලය වෙත දැනුම් දී ඇත. මේ යටතේ සංවර්ධනය කල ඉඩම් බදු පදනම යටතේ ලබා දීමටත්, සංවර්ධනය නොකල ඉඩම් නැවත පවරා ගැනීමටත්, ක්‍රියා කරමින් පවතී. අදාල කැබිනට් පත්‍රිකාව ලගදීම ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.

VI 2012 දෙසැම්බර් 31 දිනට මෙම ශේෂයට අදාලව ලැයිස්තුවක් ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබා දී ඇත.

VII සාමාන්‍යයෙන් වාහන අනතුරු සම්බන්ධයෙන් අදාළ පියවරයන් අනුගමනය කර අදාළ රක්ෂණ වන්දිය ලැබුනු පසු ගණුම් අංශය මේ සම්බන්ධයෙන් දැනුවත් කරනු ලබයි. වාහනය අළුත්වැඩියා කිරීම දෙසැම්බර් 21 දින සිදුකිරීමටත් ගිණුම් සකස් කිරීම 2012

දෙසැම්බර් 31 දිනට කළයුතු බැවින්, මෙය 2011 වසරට අදාලව ගිනුම්ගත වී නැත. එය 2012 වසර තුල ගිණුම්ගත වී ඇත.

V111 10 % පොලී ප්‍රතිශතය අදාල මුදල වාර්ෂිකව එකතුකර ගණනය කරන ලෙසට උපදෙස් ලබාදෙන ලදී.

1X 2011.12.31 දක්වා ඇති ඉඩම් අත්පත් ලේඛනයේ පුද්ගලයින්ගෙන් අති බහුතරයක් 2004 - 2011 දක්වා කාලය මෙම කාල වකවානුවට අයත් ගනුදෙණු 537 ක් අමාත්‍ය මණ්ඩල විසින් අත්හිටුවා ඇත. එමනිසා එම අත්තිකාරම් අදාල පුද්ගලයින් ඉල්ලුම් නොකරන්නේ නම් ඒ සඳහා ඉදිරි පියවර අදාල අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව කල නොහැකිව පවතී. මේ තීරණය වෙනස් කිරීම නව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත්කර ඇති අතර ඒ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබුවහොත් මෙම ශේෂ නිරවුල් කිරීම සඳහා ඉදිරි පියවර ගැනීමට හැකියාව පවතින අතර මෙතෙක් කොම්පන් සභාවට ගත හැකි පියවරයන් නොමැත.

**2:2:7 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>**

**ස්ථාවර වත්කම්**

ඉඩම් : ඉඩම් ලේඛනය යාවත්කාලීන කිරීමෙන් පසු අදාළ පියවර ගැනීමට සටහන්කර ගිතිමි.

ගොඩනැගිලි : මොනරාගල දිස්ත්‍රික් කාර්යාලීය ගොඩනැගිලි වටිනාකම සහ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිලි සඳහා වරින් වර දරණ ලද වියදම් ඇතුථ වෙනත් එකතුකල මුදල් රු.4,207,822/- ක් ලෙස ගිණුම්වල සටහන්වී ඇත. මෙය පරික්ෂාකර නිවැරදි කරන ලෙසට උපදෙස් දෙන ලදී.

පරිහරණ හා උපාංග
ලීබඩු හා සවිකිරීම්
මෝටර් රථ උපාංග
ලීබඩු හා සවිකිරීම්
කාර්යාලීය උපකරණ
සුහසාධක උපකරණ

2011 දෙසැම්බර් 31 දිනට අදාලව තොග සමීක්ෂණයක් සිදුකර සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ ඒ සම්බන්ධ වත්කම් ලේඛනයක් ද අප සතුව ඇත.

**<u>ණය අත්තිකාරම්</u>**

මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය

මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය වෙනුවෙන් මුද්‍රණ දෙපාර්තමේන් තුවටද මෝටර් රථ අථත්වැඩියාව වෙනුවෙන් යුනයිටඩ් මෝටර්ස් පුද්. සමාගමට ද රු.10,000 ක හා රු.15000/- ක් වශයෙන් පිළිවෙලින් අත්තිකාරම් ගෙවා ඇති අතර මෙම ආයතන දෙක මගින්ම වර්ථමානයේ අවශ්‍ය සේවාවන් ලබාගන්නා බැවින් ඉදිරියේදී මේ සඳහා ශේෂ සනාථ ලබාගැනීම අවශ්‍ය කටයුතු සිදුකිරීමට සටහන්කර ගතිමි.

ලෝහර් ආර්යා අරමුදල : ලැබී ඇත.

ඉන්ධන අත්තිකාරම් : ඉන්ධන අත්තිකාරම් ලෙස නිරෝෂණ එන්ටර් ප්‍රයිසස්(පුද්) සමාගම සහ එස්.ආර්.දිනමිත්‍ර යන ආයතන වෙත පිළිවෙලින් රු.75000/- හා රු.100000/- බැගින් අත්තිකාරම් තැන්පත්කර

| | | |
|---|---|---|
| | | ඇත. ඒ සඳහා ශේෂ සනාථ කිරීම් ලැබී ඇත. |
| පරිගණක වැඩ සඳහා අත්තිකාරම් | : | අල්ලස් හා දූෂණ විමර්ෂණ කොමිෂන් සභාවට යොමුකර ඇත. |
| පාරිතෝෂික වෙන්කිරීම් හා පාරිතෝෂික ගෙවීම් | : | සේවා කාලය අවු. **5** ක් සම්පූර්ණකර ඇති සේවකයින් වෙනුවෙන් පාරිතෝෂික වෙන්කිරීම් සිදුකර ඇති අතර, අවු. **55** සම්පූර්ණවීමෙන් හෝ ඊට පෙර සේවය අවසන් කළ සේවකයින් වෙනුවෙන් පාරිතෝෂික ගෙවීම් සිදුකර ඇත. මේ පිළිබඳ ඔවුන්ගේ පුද්ගලික ලිපිගොනු පරීක්ෂා කිරීමෙන් තහවුරු කරගත හැකි බව දන්වමි. |
| බොල් ණය ප්‍රතිපාදන | : | **2005** වසරට පෙර බොල් ණය ප්‍රතිපාදන ගිණුම්තුල ගැලපීම් සිදුකර ඇති අතර,මේ පිළිබඳ පදනම් වූ කරුණු වාර්තා කර ගැනීමට නොහැකි විය. |
| ලැබිය යුතු ආදායම් | : | මේ පිළිබඳ ලේඛනයක් **2012.12.31** දිනට පිළියෙල කර, ඒ සම්බන්ධයෙන් සනාථ ලිපි ලබාගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දැණුවත් කරන ලදී. |
| චන්දි අවිනිශ්චිත ගිණුම් | : | ගෙවීම් පිළිබඳ විස්තරාත්මක ලේඛන ඉදිරිපත්කල හැක. |
| ඉඩම් විකිණීම් හා අත්පත් කිරීම් පොලී දැව විකිණීම් | : : | |
| පීපල්ස් ලීසිං සමාගමේ කල් බදු වට්නාකම | | ලබාගැනීමෙන් පසු ඉදිරිපත්කල හැක. |
| ඉඩම් අත්පත්කර ගැනීම් කුඹුරු ඉඩම් විකුණුම් | | විස්තර ඉදිරිපත්කිරීමට හැක |

**2:2:8 නීති රීති රෙගුලාසි හා කළමනාකරන තීරණ වලට අනුකූල නොවීම.**

1. <u>1975 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ(සංශෝධන) පනත</u>

(අ) 42(ඇ) 1,2,3,4 වගන්ති
අනවසර නියමානුකූල කිරීම කොමිෂන් සභාව විසින් අනුගමනය කරනු ලබන පරිපාලනමය ක්‍රියා පරිපාටියකි. කෙසේ වුවත්, 1979 සන්තකය ආපසු ලබාගැනීමේ පනත යටතේ අනවසරකරුවන් සම්බන්ධව මේවන විටත්, ක්‍රියාකරගෙන යනු ලැබේ.

(ආ) කොමිෂන් සභාව සඳහා ජනාධිපති කාර්යාලය නියෝජනය කිරීමට සාමාජිකයෙකු පත්කරන ලෙස ජනාධිපති ලේකම්තුමාගෙන් දැනටමත් ඉල්ලීමක් කර ඇත.

11. <u>1971 අංක 38 දරණ මුදල් පනත</u>

(අ) ආයෝජනය කිරීම සඳහා පොදු තීරණයක් ලබා කටයුතු කරණු ලැබේ.

(ආ) අදාල වාර්තාව කොමිෂන් සභාවට ඉදිරිපත්කර කොමිෂන් සභා අනුමැතිය ලබා මාස **03** ක් නොයික්මවා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර ඇත.

(ඇ). කොමිෂන් සභාව විසින් සකස් කරනු ලබන ප්‍රගතිය ඇතුලත් වාර්ෂික වාර්තාව සෑම වර්ෂයකදීම විෂය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලබන අතර 2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභගත කිරීමට ප්‍රථම කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය තෙ ඉදිරිපත් කර ඇත.

111. **<u>1995 ජුලි 12 දිනැති එස්ඒඅයි/ඒ/4/34 දිනැති ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛ</u>**

(අ) අදාල බදු ගිවිසුමේ මේ බව සඳහන් කොන්දේසියක් තිබේ නම් ඒ අනුව සෑම වසර පහකට වරක් බදු සංශෝධනය කිරීමට පියවර ගනු ලැබේ.

(ආ) බදු නොගෙවන අවස්ථාවල බදු මුදල් අයකර ගැනීමට උපරිම උත්සාහයක් දරනු ලබයි. ඒ අනුව අදාල බදුකරුවන් ගෙන්වා සාකච්ඡාකර එම මුදල ලබාගැනීමට අවශ්‍ය උත්සාහය දරා ඇත.

මෙම සියළු උත්සාහයන් ව්‍යාර්ත වූ අවස්ථාවල බදු කාළය අවසන් කිරීමට ක්‍රියාකරන අතර බොහෝවිට ඒ සඳහා නීතිමය වශයෙන් කටයුතු කිරීමට ක්‍රියාකර ඇත.

(ඇ) අතුරු බදු දීමකදී කොම්පන් සභාවේ ලිඛිත අවසරයක් ලබාගෙන නොමැති නම් බදුකරු හා අතුරු බදුකරු ගෙන්වා බදුකරුගෙන් එය ඉවත්කොට අදාල ව්‍යාපාරය කරගෙන යනු ලබන අතුරු බදුකරු වෙත කොම්පන් සභාවේ පරිපාටි වලට අනුකූලව බදු ලබාදී යාවත්කාලීන කරනු ලැබේ.

1V. **<u>2009 අංක 09 දරණ ජාතිය ගොඩනැගීමේ පනත(ඇ) වගන්තිය</u>**

මේ පිළිබඳ අඩු ආදායම්ලාභීන්ට ඇති විය හැකි අපහසුතා හේතුවෙන් ජනාධිපති ලේකම්තුමා හරහා සුදුසු පියවරක් ගැනීමට සාකච්ඡා කරමින් පවතී.

V. **<u>ආයතන සංග්‍රහය 2 පරිච්ඡේදය 13 (3) වගන්තිය</u>**

වැඩ බැලීමේ පත් කිරීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලැබෙන තෙක් පමණි.

එහෙත් කොම්පන් සභාවේ අධ්‍යක්ෂ/මුදල්, ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ අධ්‍යක්ෂ /තක්සේරු හා වන්දි තනතුර සඳහා බඳවා ගැනීම් කිරීමට පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවීම් කර අයදුම්කරුවක් සම්මුඛ පරීක්ෂණයටද ලක් කරන ලදි.

එකී අයදුම්කරුවන් කොම්පන් සභාවේ බඳවා ගැනීම් පරිපාටියෙ සඳහන් සුදුසුකම් සපුරා නොතිබීමත් එකී තනතුරට අදාළ වැටුප් තලයට සේවයට අකමැත්ත ප්‍රකාශ කිරීමත් හේතුවෙන් බඳවා ගැනීම් කාර්යය සාර්ථක නොවීය.

එම ගැටළුවන් හේතුකොටගෙන මුදල් අංශය අභ්‍යන්තර විගණන අංශය සහ තක්සේරු වන්දි අංශය යන අංශයන්හි තනතුරේ වැඩ බැලීම සඳහා ඒ වන විට සුදුසුම නිලධාරියා වෙත අංශයේ අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා පත් කරන ලදි.

පුරප්පාඩුව පවතින මෙම ප්‍රධාන තනතුර සඳහා බඳවා ගැනීම් කිරිම සම්බන්ධයෙන් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොම්පන් සභාව වෙතින් මහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන ලද අතර කොම්පන් සභාව වෙත සකස් කරලීමට යෝජිත නව බඳවා ගැනීම් පරිපාටිය සහ සේවක සංඛ්‍යාව සඳහා අනුමැතිය ලැබෙන තෙක් කිසිදු නව බඳවා ගැනීමක් සිදු නොකරන ලෙසට දැනුම් දෙන ලදි.

මේ වන විට බඳවා ගැනීම් පරිපාටිය ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශයත් අමාත්‍යාංශයේ නිර්දේශයත් ලබා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර නව බඳවා ගැනිම් පරිපාටිය අනුමත වන තෙක් කොම්ෂන් සභාවේ කාර්යයන් අඛන්ඩව පවත්වා ගෙන යා යුතු වූයෙන් මෙම වැඩ බැලීමේ තනතුරු ලබාදීම කර ඇති අතර බඳවා ගැනීම් පරිපාටිය අනුමත කිරීමෙන් පසුව කඩිනමින් මෙම තනතුරු සඳහා සුදුස්සන් බඳවා ගැනීමට ඉදිරි කටයුතු කරනු ඇත.

**V1**. <u>මුදල් රෙගුලාසි</u>

**( අ) මූ.රෙ.502( 2)**

ස්ථාවර වත්කම් ලේඛනය එක් එක් විෂයට අදාළව සකස්කර ඇතත්, මුදල් රෙගුලාසි අනුව විධිමත්ව පවත්වාගෙන යාමට උපදෙස් ලබාදෙන ලදි.

**(ආ) මූ.රෙ. 135**

දිස්ත්‍රික් කාර්යාලයන්හි ගිණුම් කටයුතු භාර නිලධාරිණියා විසින් ගිණුම් කටයුතු සිදුකර ඇත. නමුත් මේ වන විට සියළුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් මේ පිළිබඳව දැණුවත් කොට ගිණුම් කටයුතු වලට අදාල රාජකාරි පවරන ලෙස අදාල නිලධාරීන් වෙත දන්වා යවා ඇත.

V11 **<u>2008 ජූනි 02 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය</u>**

විධායක අධ්‍යක්ෂ තනතුර හෝ ඔප්පු උපදේශක තනතුර කොම්ෂන් සභාවේ ස්ථිර සේවක සංඛ්‍යාවට ඇතුලත් වූ තනතුරක් නොවන අතර විධායක අධ්‍යක්ෂ තනතුරට නිලධාරියකු පත් කරනුයේ 1972 අංක 1 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 45 (1) ආ (1) වගන්තිය ප්‍රකාර ගරු විෂය භාර අමාත්‍යතුමා විසිනි.

ඔප්පු උපදේශක තනතුර හුදෙක්ම කොම්ෂන් සභාවේ අනුමැතිය මත යම් දීමනාවක් යටතේ සේවයේ යොදවා සිටින තාවකාලික තනතුරක් වේ.

<u>(ආ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය 2011 ජනවාරි 27 දිනැති පීඊඩී 56 චක්‍රලේඛය</u>

ඇ). **<u>2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය</u>**

**I .** ඉඩම් ප්‍රතිසංස්කරණ කොම්ෂන් සභාව වෙතින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික කාර්ය සාධන වාර්තා පිළියෙල කිරීමෙන් පසුව අමාත්‍යාංශය වෙත සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත සෑම වර්ෂයකදීම ඉදිරිපත් කර ඇත.2012 වර්ෂය සඳහා වන අර්ධ වාර්ෂික කාර්ය සාධන වාර්තාවන්ද මේ වන විටත් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති අතර ඉදිරියේදී කාර්තුමය වශයෙන් ද වාර්තා සකසා අදාල සියළුම ආයතන වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අදාල අංශයන් දැනුවත් කරන ලදි.

11. මේ අනුව කරුණු සොයාබලා ඉදිරි කටයුතු කිරීමට සටහන්කර ගන්නා ලදි.

**11.** දැනටමත් කොම්ෂන් සභාවේ සංයුතිය අනුව සාමාජිකයින් දෙදෙනෙකු විගණන හා කළමනාකරන කමිටුව සඳහා සහභාගිවනු ඇත.

**ඇ) 2011 පෙබරවාරි 21 දිනැති අංක 449 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සඳහා ඔප්පු උපදේශක ලෙස බඳවාගනු ලැබුයේ හුදෙක්ම මෙම නිලධාරියා ආයතනයේ මෙන්ම ආයතනයෙන් බාහිරව දරා තිබූ තනතුරු සැලකිල්ලට ගනිමිනි.

තවද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් සහ ඔප්පු සම්බන්ධයෙන් ඔහු සතුව පවතින දැනුම අනුව ඔප්පු උපදේශක තනතුර දැරීමට සුදුසුකම් පවතින බැවින් නව නිලධාරියකුගේ සේවය ලබා ගන්නවාට වඩා මෙම නිලධාරියාගෙන්ම අදාල සේවාව ලබා ගැනිම සුදුසු වූ බැවින් කොමිෂන් සභා අනුමැතියෙන් යුතුව මෙම බඳවා ගැනීම සිදු කරන ලදි.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මැණුම් හා වෙන් කිරීම් අංශයේ අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසු නිලධාරියකු පත් කර ගැනිමට අවස්ථා ගණනාවකදීම ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මගින් කැඳවීම් කළද ඒ සඳහා පිළිගත හැකි අයදුම්පත්‍රයන් ඉදිරිපත්වී නොමැත.

රජයේ මිණින්දෝරු දෙපාර්තමේන්තුවෙන්ද ද්විතියන පදනම මත හෝ නිලධාරියකු නිදහස් කර දෙන ලෙසට ඉල්ලීම් කළද ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් නොලැබුණ හෙයින් අවසන් වරට පළ කරන ලද පුවත්පත් දැන්වීම මත අයදුම්කරුවන් දෙදෙනෙකුගෙන් පමණක් අයදුම්පත්‍ර ලැබුණ අතර එකී අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට ලක් කිරීමක් සිදු කළද ඔවුන් විසින් කොමිෂන් සභාවේ සේවයට පැමිණීම වෙනුවෙන් බඳවාගැනීමේ පටිපාටියේ සඳහන් වැටුපට සේවය කිරීමට අකමැත්ත ප්‍රකාශ කරන ලදි.

එහෙත් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ මිණින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවයෙන් විශ්‍රාම ලබා සිටි එම්. ඩබ්. කේ. ධර්මවර්ධන මහතා ඔහු විසින් මිණින්දෝරු දෙපාර්තමේන්තු සේවයේදී අවසන් වරට ලැබූ වැටුප තමාට ගෙවීම් කරනුයේ නම් කොමිෂන් සභා සේවයට පැමිණීමට කැමති බව ප්‍රකාශ කරන ලදි.

ඒ වන විටත් මැණුම් හා වෙන්කිරීම් අංශයේ අධ්‍යක්ෂවරයකු නොමැති කමින් කාර්යාලයේ ඉඩම් මැණුම් කිරීමේ රාජකාරි බොහෝමයක් අතිරික්ත වී තිබූ හෙයින් එම්. ඩබ්. කේ. ධර්මවර්ධන මහතාගේ ඉල්ලීම මත අදාල වැටුප ගෙවීමට එකගතාවය ප්‍රකාශ කරමින් රජයේ විශ්‍රාම වැටුප අවුරා තබා අධ්‍යක්ෂ මැණුම් හා වෙන්කිරීම් තනතුරට කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගන්නා ලදි.

බඳවා ගැනීම් පටිපාටිය අනුමත වන තෙක් කිසිදු බඳවා ගැනිමක් නොකරන ලෙසට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලැබී ඇති හෙයින් සේවයේ අවශ්‍යතාවය මතත් මැණුම් හා වෙන්කිරීම් අංශයේ රාජකාරිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අත්‍යාවශ්‍ය සේවාවන් රැසක් ඉටු කරනා බැවින් ද මැණුම් හා වෙන්කිරීම් අංශයේ අංශ ප්‍රධානියා ලෙස එම්. ඩබ්. කේ. ධර්මවර්ධන මහතාගේ සේවය ලබා ගැනීමට කොමිෂන් සභාව තීරණය කරන ලදි.

තවද නව බඳවා ගැනීම් පරිපාටිය සඳහා මේ වන විට අමාත්‍යාංශ නිර්දේශයත් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශයත් ලබා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති අතර අදාල අනුමැතිය ලත් විගස අධ්‍යක්ෂ මැණුම් හා වෙන්කිරීම් තනතුර සඳහා නියමිත සුදුසුකම් වලින් හෙබි නිලධාරියකු බඳවා ගැනීම් කිරිමට කඩිනමින් කටයුතු කරන ලෙසට අදාල අංශයන් දැනුවත් කරන ලදි.

**2:2:9 මතභේදයට තුඩුදෙන ගනුදෙණු**

1. මේ පිළිබඳ කොමිෂන් සභා තීරණයක් යටතේ ක්‍රියාකර ඇත. විශේෂයෙන්ම අමාත්‍යවරයාගේ නිර්දේශය හා මෙම අයගේ අඩු ආදායම් මට්ටම මෙහිදී සැලකිල්ලට ගනු ලැබේ.

11. මේ පිළිබඳව උපලේඛණයේ විස්තර හා පැවරීම් අංශයේ විස්තරවල වෙනසක් පවතින බැවින් නිවැරදි විස්තර පසුව ඉදිරිපත් කරමි.

**2:2:10 <u>දෘශ්‍ය අක්‍රමිකතා/ අවිධිමත් ගනුදෙණු</u>**

අම්පාර දිස්ත්‍රික් කාර්යාලයේ අධ්‍යක්ෂ නිල කාමරයේ තිබූ ලිපිගොනු සහ මුදල් කුවිතාන්සි පොත් නැතිවීම සම්බන්ධයෙන් අදාල පොලිස් ස්ථානය වෙත පැමිණිලි කර ඇති අතර අදාල පොලිස් ස්ථානය විසින් අදාල පරීක්ෂණ සිදුකර ගෙන යනු ලැබේ.

මේ සම්බන්ධයෙන් අදාල වගකිවයුතු නිලධාරින් ප්‍රධාන කාර්යාලයට ගෙන්වා ප්‍රකාශ සටහන් කර ගැනීමක් සහ නැතිවූ ලිපිගොනු ලේඛණයක් ලබා ගත් අතර වැඩි දුරටත් ඉදිරි කටයුතු කිරිම සඳහා අධ්‍යක්ෂ ජනරාල් වරයා අම්පාර කාර්යාලය වෙත ගොස් වැඩිදුර පරික්ෂන කරන ලදි. කඩිනම් කරන ලෙසට අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් දෙන ලදි.

**3. <u>මූල්‍ය සමාලෝචනය</u>**

**3:1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>**

**3:2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචන</u>**

1. මෙ ප්‍රතිශතයෙන් අති බහුතර ප්‍රමාණයක් රාජ්‍ය ආයතන මගින් උදා: ජනවසම මගින් ලැබිය යුතු අතර මේ සම්බන්ධව ජනාධිපති ලේකම්තුමා හරහා යම් තීරණයකට ඒමට කොමිෂම දැනුවත් කරන ලදි.

11. සැම වර්ෂයකම මෙය සාපේක්ෂව වෙනස් වන අතර සුළු විචල්‍යතාවයක් ඇති වී ඇත.

111. මෙය වීමට හේතු වී ඇත්තේ ස්ථාවර තැන්පතුවල පොලී අනුපාතය අඩු වී ඇති නිසාය.

**4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>**

**4 :1<u>කාර්ය සාධනය</u>**

1. මෙය 2012 වර්ෂයේ දී අවස්ථා දෙකකදී වෙන වෙනම ලබාදීමට උපදෙස් දෙන ලදි.

II. බදු ලබාදීමේදී විෂයභාර ඇමතිතුමාගේ අනුමැතිය අවශ්‍ය වන අතර පසුගිය කාල වල අක්. 05 ට වැඩි ඉඩම් පැවරීමේදී අමාත්‍ය මණ්ඩල තිරණයක් ගැනීමට හා ඒ පිළිබඳ සමාලෝචන කමිටුවක් පත්කර සමාලෝචන කරමින් පැවති නිසා අදාල බදු අයකර ගැනීමේ අවශ්‍යතාවය අඩුවිය. වසර ගණනාවක් තිස්සේ අදාල ඔප්පු ලබා නොදුන් විශාල පිරිසකට කොම්පන් සබා පරිපාටිය අනුව නියමානුකුල කිරිම වේගවත් කිරිම නිසා අදාල ආදායම වැඩිවීම සිදු විය.

එමෙන්ම නොගෙවා තිබූ වන්දි ලබාගැනීමට ක්‍රියා කිරිම ද මෙම මුදල වැඩිවීමට හේතුවක් විය.

**4:2 කලමනාකරණ අකාර්යක්ෂමතා**

I බදු සම්බන්ධ ලේඛනයක් පවත්වාගෙනයනු ලබයි. එය, යාවත්කාලීන කර ඇත. විකුණා හා ඉතිරි ඉඩම් ලේඛනය ඉඩම් ලේඛනය සකස්කළ පසුව අදාල සටහන් ඇතුලත් කිරිමට උපදෙස් දී ඇත.

II. ක්ෂේත්‍ර පරික්ෂා කොට අදාල තොරතුරු ලබාගෙන ඒවා යාවත්කාලීන කරන ලෙසට උපදෙස් දෙන ලදි.

**4:3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

I. මෙම නඩුවේ ඇතුලත් කරුණු පිළිබඳව සැහීමකට පත්විය නොහැකි නිසා මේ සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් උපදෙස් ලබා ගන්නා ලදි. කෙසේ වෙතත් පවතින නීතිමය තත්වයන් අනුව මෙය ගෙවිය යුතුව පැවැතියත් අදාල මුදල් විශාලත්වය නිසා මේ සම්බන්ධ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගන්නා ලෙස ජනාධිපති ලේකම්තුමා උපදෙස් දුන් නිසා අදාල අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර ඇත.

II. මෙම තොරතුරු නිවැරදි නිරවද්‍ය නොවන අතර සමහර බදු අය කිරිම් වසර 05 කට එකවර ලබා ගන්නා අතර එවිට එය අදාල අංශයේ ලැබීමක් ලෙස සටහන් නොවේ. අදාල බදු අය කිරිමට හා එම ලේඛන යාවත්කාලීන කිරිමට උපදෙස් දෙන ලදි.

**III. (අ) කුරුණෑගල දිස්ත්‍රික්කය**

I. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉඩම් කැබලි 95 යන්න සටහනක් නොමැති නිසා නිශ්චිත අදහසක් ප්‍රකාශ කිරිම අපහසුයි. කෙසේ වෙත්ත මෙය වැඩිදුරටත් පරික්ෂා කළ යුතුව පවතී.

II. **තණහේන වත්ත ඉඩම**

අදාල සමාගමට බදු දී නියමත කාලයේ බදු සංශෝධනය සඳහා රජයේ ප්‍රධාන තක්සේරු වෙත යවා තිබුණ ද අදාල බදු තක්සේරු එවා නොතිබුණි.

ඒ අනුව බදු මුදල ලබාගැනීමට ක්‍රියාකර තිබූ අතර අදාල සමාගමේ කටයුතු ඩිසයින් පුද්.(සමා) පවරා තිබූ අතර හිග බදු මුදල් අයකරගෙන ආයෝජන මණ්ඩල අනුමත සමාගමක් නිසා ඩිසයින් පුද්. සමාගමට 2011 වර්ෂයේ තක්සේරු වටිනාකම මත බදු දීමට පියවරගෙන ඇත.

III. **කොබෙයිගනේ වත්ත**

මෙම මුදලින් දැනටමත් රු.100000/ ක් ගෙවා ඇති අතර ඉතිරි මුදල ලබාගැනීමට ක්‍රියාකරමින් පවතී.

IV. **පත්තල වත්ත**

ඔවුන් බදු මුදල් මග හැරීමකින් තොරව ගෙවන සමාගමක් වන අතර අදාල මුදල අයකර ගැනීමට ක්‍රියා කරමින් පවතී.

V. **කම්මල් වත්ත ඉඩම**

මෙය වෙනත් සමාගමක අතුරු බදු දීමක් බවට තහවුරු වී නොමැති අතර කෙසේ වෙතත් ජනතා ඇපරල් නමින් මේ වන විට රු. 2,00,000/ ක මුදලක් ගෙවා ඇත. ඉතුරු මුදලක් වේ නම් එය ගණන් බලා අයකර ගැනීමට උපදෙස් දෙන ලදී.

VI. **නැෂනල් වත්ත ඉඩම**

අදාල හිග බදු මුදල් සියල්ල ගෙවා ඇති අතර අධිභාර මුදල අයකර ගැනීමට ද ක්‍රියා කරමින් පවතී.

VII. **ශාන්ත බ්‍රිජට් වත්ත ඉඩමෙන් අක්. 02 ක් බදුදීම.**

මෙය ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් නිසා බදු ලබාදී එය බුක්තියට යාමට පෙර රු.5,00,000/- ක මුදලක් ගෙවා ඇත. කෙසේ වෙතත් අදාල සමාගම ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතු ආරම්භකර නොමැත. මේ නිසා ඒකපාර්ශිකව භුක්තිය බාරගත් අතර ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘතියක් වෙනුවෙන් මුදල් අයකර ගැනීම ගැටළු සහගත වේ.

ආ. **මාදම්පේ පුත්තලම දිස්ත්‍රික් බලමණ්ඩලය**

**I.** අදාල ලේඛනය පිළියෙල කිරීමේදී ප්‍රමාද දෝෂයකින් ඉඩමේ නිවැරදි නමින් එහෙත් එය කුරුණෑගල දිස්ත්‍රික්කය වෙනුවට පුත්තලම දිස්ත්‍රික්කය ලෙස සටහන්වීම නිසා එය සිදුවී ඇත. පුත්තලම දිස්ත්‍රික් කාර්යාල තොරතුරු ලේඛනයේ එය පුත්තලම දිස්ත්‍රික්කයට අදාල නොවන බවට ද සටහන්කර ඇත. එය නිවැරදි කිරීමට උපදෙස් දෙන ලදී.

II. කොම්පත් සභාව සතු ඉඩම් සුළු බදු ගිවිසුම් යටතේ හා ප්‍රාදේශීය ලේකම්වරු ගම් පුළුල් කිරීම යටතේ ද ප්‍රාදේශීය ලේකම්වරුන් භාරයේ තිබූ ඉඩම් **1988 - 1995** දක්වා කාලය තුල විවිධ ආකාරව බෙදාදී ඇත. එසේ ලබාගත් අය නීත්‍යානුකූල කිරීමට ප්‍රථම වෙනත් අයට පවරාදීම අනවසර ලෙස හැඳින්වේ. එසේම විවිධ දේශපාලන අධිකාරීන් විසින් ද ඒ ඒ කාල වල විවිධ ආකාරයෙන් කටයුතුකර ඇත. කෙසේ වෙතත් මෙම අනවසරකරුවන් හා පදිංචි කරුවන් සම්බන්ධව **2007** /පොදු චක්‍රලේඛය යටතේ නියමිත පරිපාටිය අනුව කටයුතු කිරීමට පියවර ගනිමින් පවතී.

III. පුත්තලම දිස්ත්‍රික් කාර්යාලය **1996** වර්ෂයේදී මාදම්පේ පිහිටුවා ඇති අතර ඊට පෙර මෙම කටයුතු කරන ලද්දේ කුරුණෑගල පිහිටි වයඹ පළාත් කාර්යාලය මගිනි. අදාල ලිපිගොනු සැදීමේදී ඉඩම් කැබලි **31** ට අදාල ගොනු පුත්තලම කාර්යාලය වෙත භාරදී නොමැති බව පෙනේ. එවැනි ඉඩම් කැබැල්ලක් සම්බන්ධව කටයුතු කිරීමේදී ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධ වී කටයුතු කරනු ලබයි. පවතින තොරතුරු සොයාගෙන උපරිම ලෙස ඒවා ගොනුවලට ඇතුලත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත.

IV. ඉඩම් ලේඛනය පූර්ණව සකසා නොමැති අතර තොරතුරු ලබා ගනිමින් සකස් වෙමින් පවතින්නකි. මේනිසා ක්ෂේත්‍රයේ හඳුනා නොගත් ඉඩම් පැවතීමේ ඉඩකඩක් පවතී. කොටටුකච්චිය ඉඩමේ අක්. **3562** ක් පමණ වන ප්‍රමාණය සඳහා 1:1 ආකෘති පත්‍රය හැර වෙනත් ලේඛනයක් නොමැත. පවතින තොරතුරු අනුව මෙය පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් කොට්ටුකච්චිය ගොවිපලේ කොටසක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව ඉදිරි පියවර ගන්නා ලෙසට දිස්ත්‍රික් අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබාදෙන ලදී.

V. **දවුල්කුරුඳු වත්ත**

දැනට මෙය කොම්පත් සභාව යටතේ පාලනයට ලබාගෙන ඇත.

V1. **රාජපක්ෂ වත්ත**

**1.** කොම්පත් සභාව සතු වූ අක්. 147 රූඩ්. 2 පර්. 10 ක් වන මෙකී කහටකුලම ඉඩම එවකට වෙන්නප්පුව පාර්ලිමේන්තු මන්ත්‍රී අෆොන්සු ෆොන්සේකා මැතිතුමාගේ යෝජනාවක් අනුව සී/ස කම්මල්පත්තු විවිධ සේවා සමූපකාර සමිතයට 1995.06.19 වන දින බුක්තිය භාරදී ඇත. ඒ සඳහා කොම්පත් සභාවේ ලිඛිත තීරණය ආදිය ගොනුව තුල නොමැත.
අදාළ ඉඩම එකී විවිධ සේවා සමිතියට භාර දුන්නද නීත්‍යානුකූල බදු ගිවිසුමක් ලබාදී නොමැති බව පෙනේ. එමෙන්ම එකී ඉඩම් කොම්පත් සභාවේ අනුමැතියකින් තොරව අදාළ විවිධ සේවා සමිතියේ සාමාජිකයින් 50 දෙනෙකු අතර බෙදාදී ඇති බව වාර්තා වන අතර 1998.05.08 ලිපියකින් කොම්පත් සභාවට අදාළ ඉඩම නැවත භාරදීමට තීරණය කර ඇති බව ද සමිතියේ සමාන්‍යාධිකාරී විසින් සභාපතිවරයා වෙත ලිඛිතව දන්වා ඇත. මේ සම්බන්ධව දිගින් දිගටම ලිපි හුවමාරු වී ඇති බවද ගොනුව අනුව පෙනී යයි.
කෙසේ වෙතත් මෙම ඉඩම 1996 දී මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මැනුම් කර අ.ග.පි. 1716 දරන පිඹුර සකසා ඇත්තේ 1979 අංක 43 දරන ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනත යටතේ තියාදන සාදන බලපත්‍ර ලබාදිම සඳහාය. නීතිමය වශයෙන් ඒ අනුව කටයුතු කිරීමට කොම්පත් සභාවට සිදුවී ඇති අතර, එහි පවතින කැබලි 158 න් සමහර කොටස් සඳහා ප්‍රාදේශීය ලේකම්තුමා විසින් සාදන පත්‍රද ලබාදී ඇත. ඉතිරි පිරිස නියමානුකූල කිරීමට කොම්පත් සභාවේ පරිපාටිය අනුව පියවර ගනිමින් පවතී.

**11.** මෙම ඉඩමේ පරිහරණ ගාස්තු ගෙවන ලෙස දැණුම් දී තිබුණද ඉඩමේ අයිතිය සම්බන්ධව නීතිමය ගැටළු කීපයක් ඇති බැවින් පාර්ශවයන් ගෙන්වා සාකච්ඡා කෙරෙමින් පවතී. එය නිරාකරනය කර ගැනීමෙන් පසු ඉදිරිපත් කරනු ලැබේ.

**111.** 1302 පිඹුර සකස් කිරීමේ අවස්ථාව වන විට කැබලි අංක 71, 72, 73, 77 හි නම් සඳහන් අය පදිංචියේ නොසිටි නිසා බුක්තිය පමණක් තහවුරු කර තිබී ඇත. එහෙත් පිඹුර සකස් කරන අවස්ථාව වන විට බුක්තියේ සිටියද අදාළ මැනුම් ගාස්තු නොගෙවීම නිසා පිඹුරට නම ඇතුලත් කර නැත. එහෙත් 2009.10.28 දින සකස් කරන ලද පරිපුරකය අනුව බුක්ති විඳි පුද්ගලයින්ගේ නම් ඇතුලත් කර පරිපුරක කැබලි විස්තර ලැයිස්තුව සකස් කර 2010.01.21 දින අධ්‍යක්ෂ/මැනුම් හා වෙන්කිරීම් විසින් එකී පරිපුරකය අනුමත කර ඇත. පදිංචිය සනාථ නොවුනද එකී පරිපුරකය අනුව 2007 පොදු චක්‍රලේඛය පරිදි පුද්ලයින්ගේ බුක්තිය අනුව ද ඉඩම් කොටස් නියමානුකූල කිරීමේ පදනම මත මෙම බිම් කොටස් සඳහාද සින්නක්කර ඔප්පු සකස් කර ඇත.

V11. **කුසල බී වත්ත**

මෙම ඉඩමේ බුක්තිය වශයෙන් අක්කර 115 ක් බාරගෙන ඇත. පසුව මෙය මූ.පි.පු. 715 අනුව මැනීමේදී අක්කර 117 ක් බව අනාවරණය වී තිබේ. පසුව 1975 වර්ෂයේ මෙය කැබලි 203 කට වෙන් කිරීමට මැනුම් නියෝගයක් නිකුත් කර තිබුණද එය ක්‍රියාත්මක වී නැත. මෙම ඉඩම සංවර්ධනය සඳහා වාලූ ඇක්වා සමාගමට බදු දී ඇත. එයින් පසුව වෙනත් අනවසරකරුවන් ඇතුළුවී පදිංචි වීම නිසා ප්‍රාථමික උසාවියේ නඩුවක් පවරා ඇති අතර එහිදී අනවසරකරුවන්ගේ බුක්තිය තහවුරු වී තිබෙන බව පෙනේ. ඒ අනුව ඉඩමේ අනවසරකරුවන් සිටින අක්කර 50 ක් පමණ ප්‍රමාණයක් සඳහා දේශපාලන අධිකාරිය මැදිහත් වී කැබලි 56 ක් පුද්ගලයන් අතර බෙදාදී ඇත. වර්තමානයේ මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට අවශ්‍ය පියවරයන් ගෙන ඇත. කෙසේ වෙතත් අදාළ බොදාදීම විධිමත් එකක් නොවන බවට කරන සඳහන නිවැරදිය. ඉතිරි අක්කර 67 ක පමණ ප්‍රමාණය ඇක්වා වාලූ සමාගම පරිහරණය කර ඇති අතර ඒ සඳහා මේ වන විට ලක්ෂ 17 කට වැඩි බදු මුදලක්ද ගෙවා ඇත. ඉතිරි බදු මුදල අයකර ගැනීමටද ක්‍රියා කරමින් සිටී.

V111. **ශාන්ත හෙලේනා වත්ත**

මෙය කො/2066 යටතේ ප්‍රකාශිත කුඹුරු ඉඩම් අක් කර 20 ක් හා ගොඩ ඉඩම් අක්කර 50 කින් සමන්විත වී ඇත. කුඹුරු ඉඩම් වශයෙන් සඳහන්ව ඇති වගුරු බිම් වල වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පසු කලෙක කොලඑලිය වැව සකස් කර ඇත. මෙම කොටස පල්ලම

ප්‍රාදේශීය ලේකම් විසින් අත්පත් කර ගැනීමට කටයුතු යොදා ඇති අතර2003 වර්ෂයේ මැනුම් නියෝග ඉල්ලා ඇතත් එය ක්‍රියාත්මක වී නොමැත. එම කොටස ප්‍රාදේශීය ලේකම්ට මැනුම් කර අත්පත් කර ගන්නා ලෙසට දන්වා යවා ඇත.

1X **කරවට්ටිකුලම් රාමන්කුලම්, පාලමාන්කුලම් හා උනාලි යන ඉඩම්**

පු/210 ප්‍රකාශකගෙන් ව්‍යස්ථාපිත නිශ්චය සඳහා රාමකුලම් ඉඩමෙන් අක්කර 50 ක බිම් ප්‍රමාණයක් ලබාදීමට මැනුම් කර ගැසට් නිවේදනයක් මගින් පවරාදී ඇත. එහෙත් අදාළ ඉඩමේ බුක්තිය ලබා ගැනීමට ප්‍රකාශකගේ උරුමකරුවන් අකමැති වී ඔවුන්ගේ ව්‍යවස්ථාපිත නිශ්චය හුවමාරු ලෙස පුත්තලම දිස්ත්‍රික්කයේ වෙනත් ස්ථාන වලින් ඉඩම් ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. ඒ අනුව තින්දෙනි තඩු වත්ත සාන තෝඩුවාව වත්ත යන ඉඩම් ඉල්ලුම් කර ඇති අතර සානතෝඩුවාව වත්ත ඉඩමෙන් අක්කර 25 ක බිම් ප්‍රමාණය මැනුම් කර 2004.09.30 දින ප්‍රකාශකගේ මුණුපුරන් වෙත බුක්තිය භාරදී ඇත. බුක්තිය භාරදුන් පසුවද අදාළ ඉඩමට අනවසරකරුවන් ඇතුල්වීම හේතුවෙන් ඔවුන් විසින් වෙනත් ඉඩම් ලබාදෙන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව ඒ අනුව අට්ටිවිල්ලුව ඉඩමින් අක්. 48 ක බිම් ප්‍රමාණයක් ලබාදීමට කටයුතු කරමින් පවතී. පු/210 ප්‍රකාශක වෙත ඔහුගේ ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ඉඩම් ලබාදීමට කොමිෂන් සභාව කිහිප අවස්ථාවකදීම උත්සාහ කලද අදාළ ඉඩම් භාර ගැනීමට සහ ඒවා ආරක්ෂා කර ගැනීමට ඔවුන් අපොහොසත් වීම නිසා ඔවුන්ගේ ව්‍යවස්ථාපිත නිශ්චය ලබා ගැනීම ඔවුන්ගේ නොසැලකිල්ල නිසා ප්‍රමාද වී ඇත.

තවද කු/210 ප්‍රකාශකගේ ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ප්‍රථමයෙන් ගැසට් පත්‍ර මගින් ලබාදී ඇති ඉඩම කොමිෂන් සභාව විසින් ක්ෂේත්‍ර පරීක්ෂා කර ඇත. ඒ අනුව එකී ඉඩම සම්බන්ධව ඉදිරියේදී ක්‍රියා මාර්ග ගන්නා බවද සඳහන් කරමි.

X **මාටින් වත්තඃ-**

විශේෂ අංක කො/2282/පු/2 යටතේ කොමිෂන් සභාවට පැවරී ඇති මාර්ටින් වත්ත ඉඩමේ අක්කර 15 ක පමණ බිම් ප්‍රමාණයක් බදු පදනම මත ලබාදීමට 1979 වසරේ කටයුතු කර තිබුණද අදාල ආයතන විසින් එකී බිම් කොටස නීත්‍යානුකූල පවරා ගැනීමක් සිදුකර නොමැත. එකී ඉඩම් කොටස කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ පවතින විට විවිධ ආයතන වෙත ව්‍යාපාර කටයුතු පවත්වා ගෙනයාම සඳහා ඉඩම් කොටස් ලබාදී ඇත. ඒ අනුව ආයතන කිහිපයක් විසින් ව්‍යාපාර පවත්වාගෙන යන අතර වර්ථමානයේදී එකී ආයතන විසින් කොමිෂන් සභාව මගින් අදාල බිම් කොටස් වල නීත්‍යානුකූල අයිතිය පවරා දෙන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව අදාළ පුද්ගලයන් හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර අදාළ ආයතන වලට මෙම කොමිෂන් සභාව විසින් නීත්‍යානුකූලව බදු ගිවිසුම්ගත කිරීම් හා මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු සිදුකරමින් පවතී.

**X1** <u>**කරඹේ වත්ත**</u>

පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය පිහිටි කරඹේ වත්ත ඉඩමෙන් ඇගළුම් කම්හල් 200 වැඩ පිළිවෙල යටතේ අක්කර 05 රූඩ් 0 පර්චස් 00 ක ප්‍රමාණයක් සුප්‍රීම් ගාමන්ට්ස් ආයතනය වෙත බදු පදනම මත ලබා දි ඇත. එම පැවරීම සඳහා අංක 3446 කොමිෂන් පත්‍රිකාව මගින් අනුමැතිය ලැබී ඇති අතර, එක් වසරක බදු මුදල පමණක් ගෙවා ඇත. හිග බදු මුදල වන රුඃ 151,131/- ක මුදල ගෙවීම් කරන ලෙස දන්වා යවා ඇතත් ගෙවීම් කර නැත. ඉන් පසු කර්මාන්ත අමාත්‍යාංශයේ ඉල්ලීම මත එම ආයතනය ගෙවීමට තිබූ හිග බදු මුදල ගෙවීමට කොරියානා එක්ස්පෝට්ස් ආයතනය ඉදිරිපත් වී ගෙවා ඇත. කර්මාන්ත අමාත්‍යාංශයේ නිර්දේශය මත කොරියානා එක්ස්පෝර්ට් (පුද්) සමාගමට ලබා දි ඇතත්, කොමිෂන් සභාව මගින් බදු ගිවිසුමක් අත්සන් කර නොමැත

ඉන් පසු කොරියානා එක්ස්පෝට්ස් ආයතනය විසින් ද ගෙවීමට ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර,කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව රෙඩි හාර්ට් සහ රිච් ලයින් පැපන් නැමති ආයතනය

වෙත විකුණා ඇති බවට දිස්ත්‍රික් අධ්‍යක්ෂ **2006.05.23** දිනැතිව වාර්තා කර ඇත. ඉන් පසු රෙඩ්හාට් ආයතනය **2007.03.26** දින දක්වා කාලයට හිග බදු මුදල් ගෙවා ඇත.

**X11** <u>**ලෙව්වම් වත්ත හා වලහපිටිය වත්ත**</u>

**1975** වර්ෂයේ අදාල ලිපිය මගින් එවැනි දැණුම්දීමක කරුණු පිලිබඳව ලිපිගොනුව අනුව අනාවරණය නොවේ. වැඩිදුරටත් ලිපගොනු පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ අදාල මුඵ ඉඩම් ප්‍රමාණය ව්‍යවස්ථාපිත නිශ්චය හා ප්‍රකාශක නොවන අයගෙන් ද අදාල සමාගම වෙත **1991.11.31** දින භාරදී ඇති බවය. මේ අනුව කොම්පත් සභාව වෙත ඉතිරි ප්‍රමාණයක් නොමැත.

**X111** <u>**කුඹුටුකුලිය වත්ත.**</u>

I කොම්පත් සභා පනත හා බලතල වලට ප්‍රකාර කොම්පත් සභාව තීරණයක් ගෙන ඇත. අධිභාරයක් යනු යම්කිසි මුදලක් ගෙවීමට දැණුම් දුන් පසු සාධාරණ හේතුවකින් තොරව සිතාමතා ඒ මුදල ගෙවීම පැහැර හරින්නේ නම්, එම පැහැර හරිනු ලබන කාලයට 10 % ක අධිභාරයක් ගෙවන ලෙස කොම්පත් සභාව විසින් දන්වා යවනු ලැබේ. එය කොම්පත් සභාවේම තීරණයක් වේ. ඒ සඳහා වෙනත් නෛයිතික පදනමක් නොමැත. කෙසේ වෙතත් අදාල නොගෙවීමට සාධාරණ හා යුක්ති සහගත හේතූන් ඉදිරිපත් කරන්නේ නම් අදාල අතිරික්ත මුදල ඉවත් කිරීමට කොම්පත් සභාව පියවර ගනු ලැබේ.

11. අදාල අක්. 74 ක ප්‍රමාණයක් ඇල්පෙක්ස් ඇක්වා සමාගමට බදු දී ඇත. ඔවුන් විසින් අදාල මුදල් නොගෙවන නිසා නීතිමය පියවර ගනිමින් පවතී. එකී අක්. 74 න් අක්. 20 ක් කොම්පත් සභාව විසින් එකම පුද්ගලයෙකුට අක්. 10 බැගින් එකම දිනයකදී විකුණා ඇති බවට කිසිදු තොරතුරක් නොමැත.

111. **කුඹුටුකුලිය ඉඩමෙන් හෙක්. 8.094 ක ප්‍රමාණයක් බදුදීම.**

හිග මුදල් අයකර ගැනීමට නීතිමය පියවර ගෙන ඇත.

<u>**XIV කාරණාව වත්ත. ඉඩමේ අක්. 01 රූඩ් .2 ක ඉඩම් ප්‍රමාණය**</u>

මේ සම්බන්ධ අදාල හිග බදු මුදල අයකර ගැනීමට නීතිමය පියවර ගනිමින් පවතී.

## ඇ. මහනුවර දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය

**1**.විධිමත් ඉඩම් ලේඛනයක් සකසා නොතිබුනු අතර ,දැනට එය සකස් කෙරෙමින් පවතී. කෙසේ වෙතත් දැනට මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම් පිලිබඳ පවතින දත්ත මත පොදු ලේඛනයක් ප්‍රධාන කාර්යාලය මගින් සකස්කර දිස්ත්‍රික් කාර්යාලයට භාරදී ඇත. එම ලේඛනය අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වශයෙන් එකී ඉඩම් වෙන්කර පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් කාර්යාලය වෙත උපදෙස් ලබාදී ඇත.

11. සඳහන්කර ඇති ඉඩම් කොටස් 12 ක් හඳුනාගත් ඒවා වන අතර මහනුවර දිස්ත්‍රික්කයට අයත් සමහරක් ලිපිගොනු ප්‍රධාන කාර්යාලයේ පැවතීම නිසා එලෙස සටහන් වී ඇති අතර තවත් සමහර ඉඩම් නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලයට අයත් ඒවා වේ. ඒ අනුව මහ/385 , මහ/496 , මහ/542, මහ/560 , මහ/360 , මහ/600 සහ මහ/620 මහනුවර දිස්ත්‍රික්කයට අයත් වන අතර එම ඉඩම් ගොනු ප්‍රධාන කාර්යාලයේ පවතී. ඒවායේ පිටපත් ප්‍රධාන කාර්යාලයෙන් ලබාගන්නා ලෙස දිස්ත්‍රික් අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබාදෙන ලදී. සෙසු ගොනුවන මහ/591, මහ/623, මහ/673 , මහ/675 සහ මහ/10804 නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් වන බව ද සඳහන් කරමි.

111. කොමිෂන් සභාව විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරාදුන් ඉඩම් ලේඛන හා නැවත ආපසු පවරාගත් ඉඩම් පිළිබඳව ගැසට් නිවේදනය හා දින සහිතව ලේඛනයක් පවතින අතර එය යාවත්කාලීන කරමින් පසුවේ. කෙසේ වෙතත් වර්ථමානයේ බලහත්කාරයෙන් ඇතුළු වී අනවසර පදිංචියට මග අහුරාඇති අතර ඒ සඳහා විවිධ ක්‍රමවේදයන් යොදා ගැනේ. ගැටළු පවතින්නේ මීට වසර 10 කට ත් පූර්ව කාලීනව ඇතුලුවී සිටින අනවසරකරුවන්ගෙන්ය.

1V. අදාල බදු ලිපිගොනු යාවත්කාලීනකර හිග බදු මුදල් අයකර ගැනීමට එක් එක් බදුකරුවන් සඳහා වෙන වෙනම පියවර ගනිමින් පවතී.

**V. අම්බලමාන වත්ත ඉඩම**

1.මෙම ඉඩම දීර්ඝ කාලීනව අනවසරකරුවන් හා පන්සල් , කෝවිල් , පාසැල් හා දෙමළ ලයින් කාමර ඇතුලුව භුක්ති විඳින බැවින් දැනටම මොවුන් නියමානුකූල කිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාලය ඉදිරි කටයුතු කරගෙන යනු ලබයි.

ඒ අනුව එක් එක් පුද්ගලයන් හා ආයතන වෙන වෙනම වාර්තා ලබාගනිමින් පවතී. එම තොරතුරු කොමිෂන් සභාවට ඉදිරිපත්කර කොමිෂන් සභා පනත හා චක්‍රලේඛයන්ට අනුව ක්‍රියාකරමින් පවතී.

11. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ඉඩම් පවරා ගැනීමේදී මෛත්‍රී කරුණාරත්න මහතාගේ පවුලට අයත් ඉඩමකින් අක්.89 රූඩ්. 2 පර්. 2 ක ප්‍රමාණයක් වැරදීමකින් කොමිෂන් සභාව පවරා ගෙන ඇත. ඒ හේතුව මත කරුණාරත්න මහතා හට විකල්ප ඉඩම් ලබාදීමට සිදුව ඇත. ඒ අනුව ඉහත ඉඩමෙන් අදාල ප්‍රමාණය මැණුම් කොට පිඹුරු පත් ද සකස්කර ඇත. ඉන්පසු අදාල ඉඩමේ භුක්තිය භාරගන්නා ලෙසට අදාල පාර්ශවය වෙත දන්වා යවා ඇත. ඒ අවස්ථාව වන විට එම ඉඩම් කොටස අනවසරකරුවන් භුක්ති විඳිමින් සිටි බැවින් , එම ඉඩම ලබා ගැනීම ප්‍රතික්ෂේප කොට ඇත.

111. දින 100 වැඩ සටහන යටතේ මහජනයා අතර බෙදාදීම සඳහා අක්. 50 ක ඉඩම් ප්‍රමාණයක් වෙන්කර ඇත. අක්.03 ක පමණ කොටසක අනවසරකැරුවන් පදිංචිව සිටින බවත් ඔවුන් නීත්‍යානුකූල කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ. කොමිෂන් සභා අනුමැතියකින් තොරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ෆයිනස් වගා කර ඇත.මේ සම්බන්ධව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් නුවර කාර්යාලය හා සාකච්ඡා කොට වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙසට නුවර අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබා දී ඇත.
දැනට මේ සම්බන්ධව වන සංරක්ෂන දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කරමින් පවතී.

1V. **<u>ජ.ත.ව.ස.ම. වෙත පවරාදීම</u>**

(1)

(11) ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා රාජ්‍ය වැවිලි සමාගම මගින් කොමිෂන් සභාව විසින් පවරාදුන් ඉඩම් පුද්ගලයින්ට සින්නක්කර ලබාදීම නීතිමය වශයෙන් නොහැකි බවට කොමිෂන් සභාවේ ස්ථාවරය වේ. ගැසට් මගින් ඔවුන්ට පවරාදුන් පසු එම අයිතිය මත එසේ

කිරීමට හැකියාව ඇති බව ඔවුන්ගේ ස්ථාවරයයි. මෙම ගැටළු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ඉදිරිපත්කර ඇති අතර නිරාකරණය සඳහා සාකච්ඡා වෙමින් පවතී.

(111) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් හා යන්ත්‍ර සූත්‍ර , ගොඩනැගිලි ජනවසම බුක්තිවිඳින කාලය තුල ඔවුන්ට උවමනා පරිදි පිටස්තර පාර්ශවයන් වෙත විකිණීම්කර ඇත. මේ සම්බන්ධයෙන් හා අනෙකුත් ප්‍රදේශවල තිබෙන මෙවැනි සිදුවීම් පිළිබඳව ද සාකච්ඡා කරගෙනයනු ලබන අතර එහිදී ගන්නා වූ පොදු තීරණය මත අලාභ ආදිය පිළිබඳ ඉදිරි පියවර ගැනීමට බලාපොරොත්තු වෙමි.

V **ක්‍රිෂ්ණමයිනිත් පුද්. සමාගම වෙත ඉඩම් පැවරීම.**

1. මෙම ඉඩම් කොටස් ද 2002 - 2004 කාලය තුල කරන ලද පැවරීම් වන අතර, එම කාලය තුල කර ඇති සමහර පැවරීම් අමාත්‍ය මණ්ඩල තීරණයකින් අත්හිටුවා ඇත. මෙය ද එම තීරණයට අයත් එකකි. ඒ අනුව ඉදිරි කටයුතු සිදුකර නැත. මෙම ඉඩමට ලබාගත් දිස්ත්‍රික් කාර්යාල වාර්තාවකට අනුව යෝජිත අක්.10 ක සිලිකා කැඩීම සිදුනොකරන බව දිස්ත්‍රික් අධ්‍යක්ෂ දන්වා ඇත. තවද මැණුම් අධ්‍යක්ෂ විසින් කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයට අනුව මෙම ඉඩම ව්‍යාපෘති සඳහා ලබාදීමෙන් පරිසරයේ ඇතිවන වලවල් නිසා භූමියේ අසමතුලිත තාවයන් හේතුවෙන් බදු දීම සතුටුදායක නොවන බව වාර්තාකර ඇත. රු.200,000/- ක අත්තිකාරම් මුදලක් අයකර ගත්තද අමාත්‍ය මණ්ඩලය මගින් තහනම්කර තිබූ බැවින් බදු පදනම මත ලබාදීමේ ඉදිරි කටයුතු සිදුකර නැත. ඒ අනුව මුදල් අයකිරීම ද සිදුකර නැත.

11. මෙම විකිණීම සිදුකර ඇත්තේ 1983 වර්ෂයේදිය . එම කාලයේදී ඇක්. 10 ක උපරිමයකට යටත්ව විවිධ ඉඩම් විකිණීම් සිදු වී ඇත. 1994 න් පසුව උපරිම අක්. 2 ක ප්‍රමාණයට සීමාකොට තීන්දු ගෙන ඇත.

ඉහත සිදුවීම 1983 වර්ෂයේ සිදුවී ඇති බැවින් එම කාලයේදී අදාල චක්‍රලේඛ අනුව කටයුතු කර ඇති බැවින් ඉහත විකිණීමට අදාලව ඉ.ප්‍ර.කො. වෙත නීතිමය පියවර ගැනීමට හැකියාවක් දැනට නොපවතී.

111. අදාල පාර්ශවයන් ගෙන්වා සාකච්ඡා කිරීමෙන් පසුව අදාල ව්‍යාපාරය අත්හිටුවීමට කටයුතුකර ඇත.

V11. <u>**වෙනත් ව්‍යාපෘති සඳහා ඉඩම් කොටස් පැවරීම.**</u>

1. 2002 - 2006 කාලය තුල අමාත්‍ය මණ්ඩලය විසින් තහනම්කළ ගනුදෙණු වලින් එකක් බැවින් නැවත අමාත්‍ය මණ්ඩල තීරණයකින් සංශෝධනය වන තෙක් බදු අයකර ගැනීමේ හෝ වෙනත් පියවරක් ගැනීමේ හැකියාව කොමිෂන් සභාව සතුව නොපවතී.

11. 1994 න් පසුව උපරිමය අක්. 02 ක් ලබාදීමට තීරණය කර ඇත. මීට පෙර අක්. 10 ක් දක්වා කොමිෂන් සභාව විකිණීම්කර ඇත. කොමිෂන් සභාව විසින් ලබාදෙනු ලබන්නේ අදාල ඉඩම ව්‍යාපාර කටයුතු කිරීමේදී ඊට අදාල බලපත්‍ර ලබාගැනීම අනිවාර්යයෙන් කළ යුතු අතර එතෙක් බදු ගිවිසුම ලබාදීම සිදුනොකරයි.

V111. **අම්බලමාන වත්තේ වතු කම්කරුවන් සඳහා වන්දි ලබාදීම.**

වතු කම්කරුවන් සඳහා ලබාදී ඇති අම්බලමාන වත්ත ඉඩමේ පිඹුරුපත් හා කට්ටි නාම ලේඛන සකස්කර ඇත. මේ වන විටත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් අපෙන් ඉල්ලීමක් කර තේ වගා සහනාධාර ලබාදීම සඳහා හිමිකම් සහතික පත් ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

නමුත් ඉඩම් නියමානුකූල කිරීමට අදාල ඉ.ප්‍ර.කො.චක්‍රලේඛ පරිදි මුදල් අයකිරීම කළ යුතුය. අදාල මුදල් ගෙවීමට කට්ටිකරුවන් දැණුවත්කර තිබූ අතර ඔවුන් එම මුදල් ගෙවීමට අපොහොසත් වූ බැවින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් කට්ටිකරුවන් වෙත ලබාදෙන වගා සහනාධාර මුදලින් අදාල මුදල් අඩුකර ඔප්පු ලිවීමට අදාල ලිපි ලේඛන දිස්ත්‍රික් කාර්යාල මගින් යොමුකර ඇත. මේ වන විටත් කට්ටිකරුවන් 48 කුගෙන් අයදුම්පත් ලැබී ඇති අතර 18 දෙනෙකුට ඔප්පු ලබාදී ඇත. ඉතිරි කට්ටිකරුවන් සඳහා ද ඔප්පු ලබාදීමේ කටයුතු සිදුවෙමින් පවතී.

**1X** <u>**දින 100 වැඩ සටහන යටතේ මැණුම් කරන ලද ඉඩම**</u>

අම්බලමාන වත්තෙන් අක්. 50 ක කොටස මැණුම්කර වෙන්කර තිබූ අතර එවකට පැවති දේශපාලන අධිකාරිය විසින් පවුල් 25 ක් පදිංචි කර තිබේ. එදා සිට අද දක්වා මොවුන් මෙම ඉඩමේ පදිංචිව සිටී. මොවුන් අනවසරකරුවන් නොවන බවත් දින 100 වැඩසටහන යටතේ ඔප්පු ලබාදීමට කටයුතු කිරීමට නොහැකි වූ පිරිසක් වන අතර, දැනට කොමිෂන් සභාව මගින් අදාල පරිපාටිය අනුව ඔප්පු ලබාදීමට අවශ්‍ය ඉදිරි පියවර ගනු ලැබේ. දැනට අම්බලමාන වත්ත සිලිකා

තිබෙන කොටස් බදු දීමේදී එය බදු වශයෙන් නොව අදාල ද්‍රව්‍ය ප්‍රමාණය යම් මැණුමකට අනුව ගණනයකර ඒ අනුව මුදල් අය කිරීම සිදුකෙරේ. මේ අනුව එයින් උපරිම ආදායම ලබාගැනීමට ක්‍රියාකෙරේ.

V1. **මහකන්ද වත්ත ඉඩම**

ඝනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරාදී ඇති සංවර්ධනයකර නොමැති ඉඩම් නැවත ඉ.ප්‍ර.කො. වෙත පවරාගැනීම සම්බන්ධව ජනාධිපති ලේකම් කාර්යාලය සමග සාකච්ඡා කරමින් පවතී. ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමකින් තොරව වුවද , අදාල ඉඩම වෙත කිසිදු සංවර්ධන කාර්යයකට නොයොදා හිස්ව පවතින අවස්ථා වලදී ඔවුන්ගේ එකගතාවය මත හෝ විරුද්ධත්වයක් නොමැති විට සංවර්ධනය හෝ වෙනත් කාර්යයන් සඳහා අදාල ඉඩම් යොදා ගැනීම සිදුකෙරේ. ඒ අතර වාරයේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට ද කටයුතු කෙරේ.

ඉඩමක් බදු දීමට පෙර අනුගමනය කළ යුතු පරිපාටිය හා ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට කාලය වැයවේ. එනම් , ඉඩමට අදාල තක්සේරුව ප්‍රධාන තක්සේරුකරුගෙන් ලබාගත යුතුය. මැණුම් කිරීමෙන් පසුව අක්‍ර 5 ට වැඩිනම් ව්‍යාපෘති කමිටුවට යොමුකර අනුමැතිය ලබාගත යුතුය. එසේම බදුකරුවන් විසින් අවශ්‍ය තොරතුරු ලබාදීම ප්‍රමාදවීම යනාදී හේතු මත අදාල ප්‍රමාදය සිදුවී ඇත. එබැවින් බදු මුදල් අයකිරීම කළ හැකිව පවතින්නේ භුක්තිය භාරදුන් දින සිට බවත්, වැඩිදුරටත් දන්වා සිටිමි. කෙසේ වෙතත් මෙහිදී භුක්තිය භාරදී ඇත්තේ 2011.09.01 දින සිට වුවද, අදාල ක්‍රියාවලිය ආරම්භ කිරීම සැලකිල්ලට ගෙන 2009 වර්ෂයට අදාලව තක්සේරුව කැඳවා 2009 සිට බදු මුදල් ගෙවන ලෙප දන්වා ඇත. ඒ අනුව පළමු වසර 5 වන 2009 - 2014 දක්වා බදු මුදල් ගෙවීම ද 2011.06.30 දිනෙන් යුතුව ජී.ඕ.ජ්.ඉන්ටර්නැෂනල් සමාගමට දැණුම් දී ඇත. වසර 5 ක බදු මුදල් එකවර හෝ වාර්ෂිකව ගෙවිය හැකි අතර, අදාල සියලු කරුණු සැලකිල්ලට ගෙන 2011.08.04 දින විධායක අධ්‍යක්ෂවරයා සමග ජේ.ඕ.ජ්.ඉන්ටර් නැෂනල් ආයතනයේ නිලධාරින් සාකච්ඡා කිරීමෙන් අනතුරුව එහිදී ඇති වූ එකගතාවය මත වාර්ෂික බදු මුදල හා රජයේ තක්සේරු ගාස්තුවන රු.226,311/- ක මුදල ගෙවීමටත්, ඉතිරි මුදල වන රු.768000/- ක මුදල වාරික 2 කින් 2012.07.01 හා 2013.07.01 දිනදී ගෙවීමට එකග වී ඇත. ඒ අනුව අදාල කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇත.

V11. **ගෝනාඩික වත්ත**

ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27(අ) 4 වගන්තිය යටතේ 2001 ජනවරා 23 දින හා අංක 1168 /16 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලද හෙක්. 56.447 ක් වූ ඉඩම් ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත භාරදෙන ලෙස 2009.07.22 වන දින ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ලිපියක් යොමුකර ඇත. මේ සම්බන්ධයෙන් ජනාධිපතිතුමා ද දැණුවත්කර ඇත.වැවිලි සමාගම් විසින් නීත්‍යානුකූල බලයක් සහිතව හෝ රහිතව පාලනය කරනු ලබන ඉඩම් සම්බන්ධව මෙවැනි ගැටළු පවතින අතර ඔවුනට ලබාදී ඇති ගිවිසුම හා ලිපි නිසා ද නීතිමය පියවර ගැනීමට ද ගැටළු පවතී.

V111. **අටබාගේ වත්ත - අක්. 39 ක් රූඩ් 2 ක් බදුදීම.**

1. විශේෂ අංක කො/671 , කො/672 යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති අටබාගේ වත්ත අක්. 39 රූඩ්. 2 ක ප්‍රමාණයකින් යුක්තය. 2003.12.01 දින ඒ.එම්.පී.බී.අතපත්තු මහතා වෙත භුක්තිය භාරදී ඇත්තිකාරම් ලෙස රු.50,000 ක් අයකරගෙන ඇත. ඉන්පසු ඔහු විසින් ඩබ්.එන්.ජේඩ්.විජේතුංග මයාට 2007.07.10 දින අතුරු බදු දී ඇත. මෙම පැවරීම් සම්බන්ධයෙන් විධායක අධ්‍යක්ෂතුමා විසින් අදාල ඉඩම් ක්ෂේත්‍රයේ පරීක්ෂාකර වාර්තාවක් ඉදිරිපත්කර ඇති අතර ඒ අනුව දැනටමත් භුක්ති විඳිමින් සංවර්ධනය කරන ඩබ්.ඒ.එන්.ජේ.විජේතුංග මහතාට විධිමත් පරිදි බදු දීම සුදුසු බවට නිරදේශකර ඇත. එසේ වුවද, 2002 - 2004 කාලය තුල සිදු වූ පැවරීමක් නිසා අමාත්‍ය මණ්ඩල අනුකමිටුව විසින් අත්හිටුවීමේ ලේඛනයට ඇතුලත්කර ඇති නිසා මේ පිළිබඳව සංශෝධිත කැබිනට් තීරණය ලද පසු ඉදිරි කටයුතු කිරීමට අධ්‍යක්ෂ ව්‍යාපෘති වෙත උපදෙස් දී ඇත. ඒ අනුව අදාල පරිපාටිය අනුව ක්‍රියාකිරීම හා හිග බදු මුදල් සම්බන්ධව සුදුසු පියවරක් ගැනීමට හැකියාව ඇත.නීත්‍යානුකූල පියවරක් මේ සම්බන්ධව කර නොමැති බැවින් අතුරු බදු දීම නීති විරෝධීවන නිසා ඉදිරියේදී සංශෝධිත අමාත්‍ය මණ්ඩල තීරණයක් ලැබීමෙන් පසුව මේ සම්බන්ධව ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

11. ඉහත පිළිතුරින් පැහැදිලිකර ඇත. ඉහත සඳහන් පරිදි නීත්‍යානුකූල බදු අයකර ගැනීමක් නොපවතී. කලහැකි වන්නේ බදුකරු ඉවත් කිරීම හෝ ඔවුන්ගෙන් අත්තිකාරම් මුදලක් ලබාගෙන ඇති නිසා ඒ සම්බන්ධව ගැටළු පැන නගී.

1X කුරුදු වත්ත ඉඩමෙන් පර්. 15 ක ප්‍රමාණයක් සී/ස ගිරාඋල්ල නැගෙනහිර සණස සමිතිය වෙත බදුදීම.

ඉහත පිඹුරේ බදු දීමක් යන්න ප්‍රමාද දෝෂයකින් සඳහන් වුවත්, එය විකිණීම් වශයෙන් සංශෝධනය වී ඇත. ඒ අනුව ඉදිරියේදී නියමානුකූල කිරීමට කටයුතු කරමින් පවතී.

X **විල්ටන් වත්ත තේ කර්මාන්ත ශාලාව බදු දීම**

1. **1997** අගෝස්තු **30** දින සී/ස සුපර් ඉන්ඩස්ට්‍රීස් නම් ආයකතනයට බදු දීමෙන් පවරා දී ඇති ඉඩමට අදාල පිඹුරු අංක **1701** හි අක්. **02** රූඩ්.**1** පර්. **14.05** ක් මැන ඇත. එහි අක්. **1.1/2** ක් පමණ ඉතිරිවන පරිදි අනවසරකරුවන් ඇතුල්වී භුක්තිවිඳින නිසා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හා අදාල ආයතනය අතර බදු ගිවිසුම් පතක් අත්සන් කිරීමට නොහැකිව ඇත. කෙසේ වෙතත් මෙය නිරාකරණය කිරීමට පාර්ශවයන් සමග සාකච්ජා කරමින් පවතී.

11. අදාල ගිවිසුම **1995** වර්ෂයේ අවලංගු කර ඇති බැවින් ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාවක් නොපවතී. කෙසේ වෙතත් සී/ස සුපර් ඉන්ඩස්ට්‍රීස් ආයතනය අදාල බදු මුදල නිශ්චිත කාලයක් තුල නොගෙවන්නේ නම් නීතිමය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

111. අදාල අතුරු බදු දීම නිතයානුතුල නොවන අතර කොමිෂන් සභාවට ලැබිය යුතු නියමිත බදු මුදල් අදාල ආයතනයෙන් ලබාගැනීමට නීතිමය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

X1. **ඔරායන් වත්ත**

මේ සම්බන්ධයෙන් ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තාවක් ලබාගැනීමෙන් පසුව ඉදිරි පියවර ගැනීමට නියමිතය.

X11. **ඉඹුල්පිටිය වත්ත**

මහනුවර දිස්ත්‍රික්කයේ පසුබාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ඉඹුල්පිටිය වත්ත **1982.03.12** වැනි දින අංක **103/10** ගැසට් පත්‍රය මගින් ජනාතා වතු සංවර්ධන මණ්ඩලයට පවරාදී ඇත. ඉහත ගැසට් පත්‍රය මගින් පවරාදී ඇති ප්‍රමාණය කහවත්ත වැව්ලි සමාගමට ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් බදු දී ඇත. එම ඉඩමේ තැනින් තැන පිහිටා ඇති කළුගල් කොටස් ව්‍යාපෘති වශයෙන් ලබාදෙන ලෙසට ප්‍රදේශයේ පුද්ගලයින් විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ඉල්ලීම් කර ඇත. අදාල ඉඩම්වල මැණික් සම්පත් අයිතිය නීතිමය ප්‍රකාර කොමිෂන් සභාව සතු වුවද එවකට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව භාරව පැවති වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා නිකුත්කර ඇති ලිපියක් හා බදු ගිවිසුම මහා භාණ්ඩාගාරයෙන් නිකුත්කර ඇති ලිපි නිසා එකී අයිතිය සමාගම් සතු බවට ඔවුන් හිමිකම් කියාපායි. මෙම ගැටළුව

නොවිසඳී පවතී. කෙසේ වෙතත් 2012.01.04 දින සභාපති, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලිපියක් යොමුකරමින් බතිජ හා දැව වල අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු බවත් ඉහත සඳහන් අක්. 50 ක ප්‍රමාණයේ පිහිටි කථගල් සහිත කොටස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත භාරදෙන ලෙස දන්වා ඇත.

මෙම ගැටළු නිරාකරණය කර ගන්නා තෙක් ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට නොහැකිව පවතී. ඒ තත්වයතුල පවා අනවසර පුද්ගලයින් ගල්කැඩීම හේතුවෙන් කොමිෂන් සභාවට අහිමිවන ආදායම ලබාගැනීමට කටයුතු කෙරෙමින් පවතී.

X111 මේ සම්බන්ධයෙන් ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවක් අපේක්ෂා කරන අතර එය ලැබුණු පසු අවශ්‍ය පියවර ගනු ලැබේ.

X1V වසර 18 කට වැඩි කාලයක් භුක්ති විඳි බව පොල්ගොල්ල මහතා ප්‍රකාශ කල ද 2007 වර්සයේදී කොමිෂන් සභාව අංක 6374 දරණ තීරණය මගින් 2007 වසරේ තක්සේරුව මත බදු දීමට තීරණයකර ඇත. යම් වසරක ඊට අදාල තක්සේරුව ගණනය කරන විට එදින සිට එය බලපැවැත්වේ. එසේ නොමැති නම් වසර 18 කට පෙර තක්සේරුව ලබාගත යුතු වන අතර එහිදී කොමිෂමට මුල්‍යමය වශයෙන් අහිතකර වීමට ඉඩ පවතී. කෙසේ වෙතත් මෙම තත්වය අවධානයට ගෙව ඒ අනුව ක්‍රියාකර ඇත.

ඉන්පසු එම ඉල්ලීමට අනුව 2007.03.26 දිනැති අංක 6374 දරණ කොමිෂන් පත්‍රිකාව කොමිෂන් සභාවට යොමුකර ඇත. එහි තීරණය වූයේ පර්. 39.25 ක ප්‍රමාණය ඒ.එම්ඹල්.බී. පොල්ගොල්ල මහතා වෙත වර්ථමාන වෙළඳපල වටිනාකම මත 22(අ)ආ වගන්තිය යටතේ වසර 30 ක කාලයකට බදු පදනම මත ලබාදීමටය. ඒ සඳහා 2009.08.25 දින අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලැබී ඇත. වසර 5 කට අදාල බදු කුලිය ලෙස තකසේරු ගාස්තුව වන රු. 86.315 ක මුදල 2011.06.30 දින ගෙවා ඇත.

XV උඩුනුවර මැතිවරණ කොට්ඨාශයේ පිහිටි සින්දුරන්කන්ද නැමති ඉඩමෙන් අක්.01 පර්. 15 ක් එස්.එම්.පී. බණ්ඩා මහතා විසින් අවු. 29 ක් තිස්සේ භුක්ති විඳිනකු ලැබුවත් ඔහු වෙත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කොට ඇත්තේ පර්. 20 ක ප්‍රමාණයක් ලබාදීමටය. ඉතිරි ඉඩම් ප්‍රමාණය ඉ.ප්‍ර.කො.සභාව විසින් අධ්‍යක්ෂ ඉඩම් පැවරීම්ගේ අංක 15/6/4 කථගල් 7 හා 2003.01.03 දිනැති මැණුම් නියෝගයට අනුව කට්ටිකරුවන් 10 කු වෙත පර්. 16 බැගින් වූ ඉඩම් කොටස් කැබලි කර අංක 1620 දරණ පිඹුර සකස්කර ඇති අතර එහිදී කට්ටකිකරුවන් වෙතින් 2002.07.01 දින රු.10,000 බැගින් තක්සේරු අත්තිකාරම් මුදල් ද අයකර ඇත.

කථගල් කැඩීමට පෙර ලබාදිය යුතුව පවතින මධ්‍යම පරිසර අධිකාරිය හා පතල් කැණීම් අංශයේ නිර්දේශිත වාර්තාව මෙතෙක් ලබාදී නොමැත. එයට හේතු වී ඇත්තේ මෙම ඉඩමේ ආරණ්‍ය සේනාසනයක් පැවතීමත් අවට ගම්වාසීන් විසින් කථගල් කැඩීමේ ව්‍යාපෘතියට විරුද්ධත්වය පළකරමින් අතිගරු ජනාධිපතිතුමා වෙත හා අදාල ආයතන

වෙත පැමිණිලි ඉදිරිපත්කර ඇති නිසාත්ය. එකී හේතුන් මත අදාල ඉදිරි කටයුතු කිරීමට නොහැකිව ඇත.

**4:4 හඳුනාගත්නාලද පාඩු**

I. අදාල හෙළිදරව් කිරීම් මේ වසරේදී ඇතුලත්කරන ලෙසට උපදෙස් ලබාදෙන ලදී.

II. මෙම වාහන අනතුර සම්බන්ධයෙන් මු.රෙ.104 ප්‍රකාරව මූලික විමර්ශනයක් සිදුකරන ලද අතර එකී විමර්ශනය වාහනයේ කාර්මික දෝෂයක් බවට තීරණය ලබාදී ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු කර ඇත.

**4:5 කාර්ය මණ්ඩල පරිපාලනය**

I. අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කිරීමට ජනාධිපති ලේකම්තුමාගේ නිර්දේශය මත වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමු කිරීමෙන් පසු වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය මත කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මත මේ වන විටත් යොමුකර ඇත.

II. අදාල පුරප්පාඩු නව බඳවා ගැනීම් පරිපාටිය අනුමත වූ පසු පුරප්පාඩු සියල්ල පිරවීමට කටයුතු කෙරෙනු ඇත.

**<u>4: 6 වාහන උපයෝජනය</u>**

I. **2011** වර්ෂය තුල අවස්ථා **5** කදී පමණ වාහන අළුත්වැඩියා සඳහා රු.**100000/-** ඉක්මවා වියදම් දරා ඇත. කොමිෂන් සභාව සතු පැරණි වාහන දැනට රාජකාරියේ යොදවන බැවින් මෙම වියදම් පෙර වර්ෂයට වඩා සුළු වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

II. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සංචිතයේ තිබෙන්නාවූ සියළුම වාහන සම්බන්ධයෙන් සිදුවන්නා වූ යම් අනතුරක් සම්බන්ධයෙන් මු. රෙ. **104(3)** ප්‍රකාරව මූලික විමර්ෂණ කටයුතු සිදු කරන අතර මෙතෙක් ඔබ වෙත ඉදිරිපත් කර නොමැති වාර්තා තිබේනම් පරීක්ෂාකර බලා කඩිනමින් ලබා දෙන ලෙසට අදාල අංශයන් දැනුවත් කරන ලදි.

III. මෙහිදී අදාල අනතුර රියදුරුගේ නොසැලකිලිමත්භාවය නිසා තහවුරුවී නොමැති නිසා අදාල ක්‍රියාපරිපාටිය අනුගමනය කර ඇත.

**5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**<u>5:1 සංයුක්ත සැලැස්ම</u>**

1. **2011 - 2015** වර්ෂ සඳහා සකස් කරන ලද සංයුක්ත සැලැස්මේ තිබූ අඩුපාඩු සියල්ල අවම කරමින් ඉතාමත් නිවැරදි වූ තොරතුරු ඇතුලත් කර **2012-2016** වර්ෂයන් සඳහා අදාල සංයුක්ත සැලැස්ම සකස් කර ඇත.

II. මෙවැනි අඩුපාඩු ඉදිරියේදී සිදු නොවිය යුතු බවටත් අදාල අංශය දැනුවත් කරන ලදි.

**<u>5:2 ක්‍රියාකාරි සැලැස්ම</u>**

I. ඉදිරියේදී නියමිත ක්‍රියාපරිපාටිය අනුගමනය කිරීමට සටහන් කර ගතිමි.

11. ක්‍රියාත්මක සැලැස්මේ ඇතුලත් නොකලද නුවරඑළිය දිස්ත්‍රික් අධ්‍යක්ෂ වෙත මෙහි වගකීම පවරා සිටි අතර, ඔහු විසින් දැනටමත් එහි කටයුතු අවසන්කර ඇත.

111. ඉදිරියේදී ඇස්තමේන්තුගත කරන ලද ක්‍රියාවන් අනුව කටයුතු කරන ලෙසට අදාල අංශ දැණුවත් කරන ලදී.

1V. ඉදිරියේදී ක්‍රමවත් අයුරින් ඉටු කිරීමට අදාල අංශ දැණුවත් කරන ලදි.

V. අදාල පාර්ශවයන් සමග සාකච්ජාකර ඉදිරියේදී ක්‍රමවත් අයුරින් ඉටු කිරීමට දැණුවත් කරන ලදී.

**<u>5:3 අභ්‍යන්තර විගණනය</u>**

I. බඳවා ගැනීම් පරිපාටිය අනුමතවීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම තනතුරට නිලධාරියෙකු බඳවා ගැනීම් කිරීමට නොහැකිව පවතී.

II. **2012** වර්ෂයේදී නිවරදිකර කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසට අදාල අංශ දැණුවත් කරන ලදී.

**5:4 විගණන හා කලමණාකරන කමිටු**

ජනාධිපති ලේකම්තුමා දැණුවත්කර ජනාධිපති කාර්යාලය නියෝජනය කරමින් සාමාජිකයෙකු පත්කිරීම සම්බන්ධයෙන් කඩිනමින් ඉදිරි කටයුතු කරන ලෙසට අදාල අංශ දැණුවත් කරන ලදි.

**5:5 අයවැය පාලනය**

මේ පිළිබඳව දැඩි අවධානය යොමුකරන ලෙසට අදාල අංශ දැණුවත් කරන ලදි.

**6. පද්ධති හා පාලනය**

**I. ආදායම් අංශ වාර්තා හා ගිණුම් අංශ ආදායම් වාර්තා**

**II. මුදල් පිලිබඳ පාලනය**

(අ) සහ (ආ)

විගණන විමසුම් මගින් පෙන්වා දි තිබූ ගිණුම්කරන අඩුපාඩු හැකිතාක් දුරට මග හරවා ගෙන රාජකාරි ඉටු කරන ලෙසත් කාර්යාලයේ ගිණුම් කටයුතු භාර නිලධාරිනියට ගිණුම් රාජකාරි කටයුතු පමණක් භාර දෙන ලෙසත් වෙනත් බාහිර රාජකාරි ඇය වෙත නොපවරන ලෙසටත් සියළුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරිමට කටයුතු කරන ලදි.

තවද මුදල් අයකිරිමේ කටයුතු සතියේ සඳුදා හා බදාදා දිනයන්හි පමණක් සිදු කිරිමටත් අදාල ගනුදෙනු පිලිබඳව එදිනෙදාම සටහන් කිරිමටත් මුදල් පොත ක්‍රමවත්ව පවත්වා ගෙන යාමටත් කටයුතු කරන ලෙසටද කාර්යාලය සතු මුදල් මුදල් සේප්පුවේ තැන්පත් කල යුතු බවත් දිස්ත්‍රික් කාර්යාල ගිණුම් සම්බන්ධ රාජකාරි ඉටු කරනු ලබන නිලධාරින් දැනුවත් කිරිමටත් කටයුතු කරන ලද අතර මෙම රාජකාරි නිසි පරිදි ඉටු කිරිම සම්බන්දධ පසු විපරම් කරන ලෙසට ප්‍රධාන කාර්යාලයේ අදාල අංශයන් දැනුවත් කරන ලදි.

**<u>II1. නිවාඩු ලේඛණය හා පැමිණිමේ ලේඛණය</u>**

**(අ) පැමිණිමේ ලේඛණය (ආ) නිවාඩු ලේඛණය**

විගණන විමසුම් මගින් පෙන්වා දි තිබූ පරිදි දිස්ත්‍රික් කාර්යාල නිලධාරින්ගේ පැමිණිමේ ලේඛණය නිවැරදිව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් නිවැරදි උපදෙස් ලබා දී ඇති අතර පෙන්වා දි තිබූ අඩුපාඩු සියල්ල නිවරදි කර නිවාඩු ලේඛණය යාවත්කාලින කර පවත්වා ගෙන යන ලෙසත් කාර්යාලයේ රාජකාරි බෙදිමේදී නිවාඩු ලේඛණය පවත්වා ගෙන යාමට එක් නිලධාරියකුට ලිඛිතව භාර දිමටත් රාජකාරි අධීක්ෂණය කිරිම මාණ්ඩලික සහකාර වෙත පවරන ලෙසත් දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් දැනුවත් කරන ලදි.

තවද දිස්ත්‍රික් කාර්යාල නිලධාරින්ගේ පැමිණීම පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු කර ඇති බැවින් 2012 වර්ෂයේදී පැමිණීමේ ලේඛණය සම්බන්ධයෙන් පෙර ඇතිවන ලද ගැටළුකාරී තත්වයන් බොහෝ දුරට මග හරවා ගත හැකි බව දන්වනු කැමැක්තෙමි.

**1V ඉදිරි වැඩසටහන් හා කල වැඩවාර්තා**

විගණන විමසුමෙන් පෙන්වා දී තිබූ පරිදි ක්ෂේත්‍ර නිලධාරින් හා දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්ගේ ඉදිරිවැඩ සටහන් පූර්ව මාසයේ 25 වන දිනට පෙර ඉදිරිපත් කර අනුමත කරවා ගත යුතු බවට උපදෙස් ලබා දෙන ලදි.

තවද සෙසු නිලධාරින් හා දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් විස්න් ඉදිරිපත් කරනු ලබන මාසික ඉදිරිවැඩ සටහන් සංශෝධිත වැඩ සටහන් කලවැඩ සටහන් විස්තරයන් විධිමත් හා ක්‍රමවත් පරිදි ඉදිරිපත් කිරීමට අවශ්‍ය දැනුවත් කිරීම් කටයුතු කඩිනමින් ආරම්භ කරන ලෙසට අධ්‍යක්ෂ ජනරාල් වෙත වගකීම පවරන ලද අතර එහි පසු විපරම් කටයුතු සිදු කරන ලෙසට අභ්‍යන්තර විගණක අංශය දැනුවත් කරන ලදි.

**V. දිස්ත්‍රික් බලමණ්ඩල ඉඩම් ලේඛන**

මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම මේ වන විටත් ආරම්භ කර ඇත. අධ්‍යක්ෂ ජනරාල් විසින් දිස්ත්‍රික් කාර්යාල කීපයකම රාජකාරි අධීක්ෂණය කර ඇති අතර දිස්ත්‍රික්කයට අදාල පැවැරුනු ඉඩම් පිලිබඳව ලේඛණය, බදු ලේඛණය, අනවසරයෙන් පදිංචිවීම් පිළිබඳ වාර්තා සහ දිස්ත්‍රික් කාර්යාලයට අයත් ප්‍රධාන ලිපිගොනු පැහැදිලිව හඳුනා ගත හැනි පරිදි පවත්වා ගෙන යාමටත් කටයුතු කරන ලෙසට අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම සිදු කර ඇත.

සෑම දිසිත්‍රික් කාර්යාලයකටම ලිපිගොනු ආරක්ෂිතව ගබඩා කිරීම සඳහා ලිපිගොනු කැබිනට් ලබා දී ඇති අතර රාජකාරි ලිපිගොනු සියල්ල යාවත්කාලීන කර ඒවාහි තැන්පත් කරන ලෙසට හා දැනට වැඩ කිරීමට ඇති ගොනු වෙන් කොට ලිපිගොනු ලේඛනයක් සකස් කර නිසි පරිදි අංකනය කොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ලෙස වෙන් කර ලිපිගොනු ස්ථාපිත කල යුතු බවටත් උපදෙස් ලබා දී ඇති බව ද සඳහන් කරමි.

**V1. ඉඩම් ලිපිගොනු පවත්වා ගැනීම හා ගබඩා කිරීම.**

අධිනීතිඥ නිමල් ජී.පුංචිහේවා
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව